2021 ජුලි
03 කාණ්ඩය 04 කලාපය
ISSN 25792369
ආධාරය රු:50/-

# FORWARD

සටන් කරන තාරුණ්‍යයට



එක්ව අපි පියාඹමු...



# සෙල්වෙඩි සිරස මත නැවතුණු විනාඩිය

දැන් හැඩට පේනවද අපිව?
පින්තූරේ ගන්න ඉක්මණට!
දුවන්න වෙයි විගහට,
අහසින් ගිනිබෝල වැටෙන ඒ 'සෙල්ලම'
පටන්ගත්තොත් ඉක්මණට...
අම්මා කිව්වා වගේම
පැරදෙන්න වෙයි අපි දෙන්නටම
ඒ 'සෙල්ලමට'!!...

# මියගියේ නැත ඔබ!

## රෝහණ විජේවීර



සෝවියට් රුසියාව මේ වනවිට බිඳවැටී තිබුණද ඔබ සාර් ගැන කතානොකරයි. නමුත් ලෙනින් ගැන කතාකරයි. චීනයේ චීයැං කායි ෂෙක් යනු කවරෙක්දැයි නොදන්නාමුත් මාඕ සේතුං පිළිබඳව ලොවක් දනී. කියුබාවේ ෆිදෙල් කස්ත්‍රෝ ගැනද නොදන්නා අයෙක් නැත. නමුත් බැටිස්ටා වෙනුවෙන් කතාකරන්නේ කව්ද?

එදා ධනවාදය බැබළෙමින් තිබූ වකවානුවක ලෝක ධනපති පංතියට හිසරදයක් වූ කාල්මාක්ස්, එංගල්ස්, ලෙනින්ලා අද ඉතිහාසයක නිර්මාතෘවරු ලෙස හඳුන්වති. එදා ත්‍රස්තවාදියෙකු ලෙසූ හංවඩු ගැසූ චේ ගුවේරා අද ලෝක තාරුණ්‍යයේ සංකේතය වී ඇත.

කලකදී ජනතාව පීඩනයට පත්කරමින් වැජඹුණු පාලකයින් ඉතිහාසය විසින්ම කුණුකූඩයට දැමෙද්දී, ජනතාව වෙනුවෙන් දිවිහිමියෙන් සටන්වැදුණු මිනිසුන් ඉතිහාසගත වන්නේ කිසිදාක නොමැකෙන ලෙසිනි..

එදා සාධාරණ, නිවහල් සමාජයක් නිර්මාණය කිරීමේ උත්තුංග අරමුණ පෙරදැරිව, ධනපති දේශපාලකයින්ට ගොදුරුව තිබූ ලාංකීය සමාජය නවමු දිශාවකට මෙහෙය වූ පළමු වෘත්තීය විප්ලවවාදියා; අසාහය නායකයා ජනතා විමුක්ති පෙරමුණේ නිර්මාතෘ; රෝහණ විජේවීරයන් පිළිබඳවද අද ලොවක් කතාකරන්නේද ඊට නොවෙනස්වය..

1943 ජූලි මස 14 වැනි දින ගාල්ලේදී උපත ලද ඔහු සිය ජීවිතයට හුස්මදෙන්නේ අන්‍යන්ගේ ජීවිත වෙනුවෙන් කැපවෙමිනි. මිනිසෙකු වරක් පමණක් ලබන වටිනාම වස්තුව වන ජීවිතයට විජේවීරයන් අවුරුදු 46ක් වැනි කෙටිකලකදී සමුදෙන්නේද මෙරටේ සුවහසක් පීඩිත ජනතාව වෙනුවෙන් වචනයෙන්, ක්‍රියාවෙන් මෙන්ම ජීවිතයෙන්ද කැපවෙමිනි...

අතිදක්ෂ වෛද්‍යවරයකු වී ඔහුගේ පෞද්ගලික ජීවිතය ගොඩනගාගන්නවා වෙනුවට, ඔහුට ලැබීමට තිබූ සැපසම්පත්, ගරුබුහුමන්වලින් අනූන ජීවිතය වෙනුවට සිය වෛද්‍ය උපාධියද පසෙක තබා, ඔහු බහුතර මිනිසුන්ගේ සුබවිහරණය වෙනුවෙන් සමාජ ජීවිතය තෝරාගන්නේය...

ධනවාදයටම රුකුල්දෙමින් ජනතාව රවටන දේශපාලන පක්ෂ හමුවේ, නිවැරදි නිර්ධන පංති ව්‍යාපාරයක අවශ්‍යතාව කල්තියා හැඳිනගැනීමට තරම් ඔහු දූරදර්ශී විය. තනි තනි පුද්ගලයන් සුවපත් කිරීම වෙනුවට, මෙරටේ සුවහසක් දුක්විඳින ජනතාවගේ ජීවිත සුවපත් කිරීමේ අභිලෂයෙන් 1965දී ඒ වනවිට යන්තම් අවුරුදු 22ක් පමණක් වූ රෝහණ විජේවීර නම් තරුණයා මෙරටේ නිර්ධනීන්ගේ පක්ෂය වන ජනතා විමුක්ති පෙරමුණ නිර්මාණය කරන්නේ ඒ අනුවය..

ඔහු එලෙස ගොඩනගාගත් තම පක්ෂය, එහි අරමුණු හෝ රටේ දුක්විඳින ජනතාවගේ අනාගතය කිසිවිටෙකත් තම පුද්ගලික අභිලාෂයන් වෙනුවෙන් උකසට තැබුවේ නැත. නමුත් ඒ වෙනුවෙන් ඕනෑම කැපකිරීමක් කළ හැකි බව ඔහු ආදර්ශයෙන්ම ඔප්පු කළේය. පක්ෂයක් ගොඩනැගීම සඳහා ගොවිපළවල්වල වැඩකරමින්, ලොරිවලට බඩු පටවමින් කැපවූ නායකයා ඔහුය. ඔහුගේ වීර්යය හා අධිෂ්ඨානය කෙතරම් ප්‍රබලවීද යත්, පක්ෂය ගොඩනැගීමේදී ඒ සඳහා සහයෝගය ලබාගැනීමට එකම පුද්ගලයාව හැටදෙවතාවක් හමුවීමට ගියේය..

"ජාතික ප්‍රශ්නයට විසඳුම රට දෙකඩ කිරීම නෙවෙයි.."

අර්බුදයන් හමුවේ ධනපති නායකයින් ජාතිවාදය වපුරන විට විජේවීරයන් ප්‍රශ්නයේ ගැඹුර හඳුනාගත්තා පමණක් නොව, ඒ සඳහා නිවැරදි විසඳුම්ද ඉදිරිපත් කළේ ධනපතියන්ගේ ආත්මාර්ථය ප්‍රතික්ෂේප කරමිනි. ඔහු විසින් රචිත "දෙමළ ඊළම් අරගලයට විසඳුම කුමක්ද?" ග්‍රන්ථය අදටත් මෙරටේ ජාතිවාදය පිළිබඳව බිහිවූ හොඳම කියවීම වන්නේ එබැවිනි.

නායකයා වුවද සාමූහිකත්වයේදී විජේවීර එකාධිපතියෙකු වූයේ නැත. ඔහු නිතරම සහෝදර සගයින් පිළිබඳ සොයා බැලුවේය. නායකයා හා අතවැසියා වෙනුවට ජනතා විමුක්ති පෙරමුණ තුළ "සහෝදරයෝ" හමුවන්නේ එබැවිනි. ඉතිහාසයේ දේශපාලන ව්‍යාපාරයක් තුළ බිහිවූ එකම සංස්කෘතියේ නියමුවා ඔහුයි. "උතුරු කොනේ නුඹ හිනැහේ.." යැයි ජාතික එකමුතුව වෙනුවෙන් ගැයූ විමුක්ති ගී බිහිවූයේද ඒ සංස්කෘතිය තුළයි. මත්පැන්, දුම්බීම ස්වෙච්ඡාවෙන්ම අතහැර, ඒ මුදල්ද පක්ෂය ගොඩනැගීම වෙනුවෙන් යොදවන, අද වන විට මංත්‍රී වැටුප් පවා පක්ෂයේ අරමුදලට බැරකරන, පුද්ගලික වාසි නොතකා දේශපාලනය කරන ඒ ගෞරවනීය සංස්කෘතියේ නිර්මාපකයා ඔහුයි...

ඔහු සියලු මිනිසුන්ට අසීමිතව ආදරය කළ මිනිසෙකි. ආදරණීය පුතෙකි. සහෝදරයෙකි. සියලු නිර්ධන පාංතිකයින්ගේම සහෝදරයෙකි. ඔහු ආදරෙන් තෙද සැමියෙකි. සෙනෙහසින් පිරිපුන් පියෙකි. සුවහසක් දුවාදරුවන්ගේ අනාගතය සුරැකීමට දිවි පිදූ ආදරණීය පියෙකි... කවරාකාරයේ අවලාදයන් නැගුවද, ඇස්, ඉස්, මස්, ලේ උගුල්ලා මර්ධනයන් ක්‍රියාත්මක කළද අදටත් රෝහණ විජේවීර නම් මානවහිතවාදී නායකයා ජීවමාන වන්නේ එබැවිනි.

# බෙදී වෙන්වීම වෙනුවට සහෝදරත්වයෙන් ගොඩයන එක Trend එකක් කරන්න ඕනා



*සමාජවාදී තරුණ සංගමයේ ජාතික සංවිධායක*
***එරංග ගුණසේකර***
*සහෝදරයා සමඟ කළ සංවාදය*

**සමාජවාදී තරුණ සංගමය විදියට අවුරුදු ගණනාවක් තිස්සෙම අපේ රටේ ජාතික සමගිය වෙනුවෙන් ලොකු වැඩ කොටසක් ඉටු කරමින් ඉන්න බව අපි දන්නවා. "සහෝදරත්වයේ දිනය" කියලා කියන්නේ එහි ඉතාම සුවිශේෂී අවස්ථාවක්. ඒ ගැන විස්තර ටිකක් කියමුද?**

ඔබට මතක නම් යුද්ධය අවසන් වෙන්නත් පෙර සිටම අපි "සහෝදරත්වයේ දිනය" නමින් ජාතික සමගි වැඩසටහනක් ක්‍රියාත්මක කළා. මොකද ජාතිකත්වයන් අතර සහෝදරත්වය ඇති කරන්න යුද්ධයකට බැරි බව අපි දන්නවා. ඒ නිසා 1983 කළු ජූලියේ අඳුරු මතකයන් පිරුණු තීරණාත්මක දිනයක් වෙච්ච ජූලි 23 වැනිදාව එයින් පසුව ආදරය, සහෝදරත්වය පිරුණු දිනයක් බවට පත් කරන්න අපට වුවමනා වුණා.

ඇත්තටම ඉතිහාසයේ ඉඳන්ම අපේ සමාජය තුළ ජාතිවාදය කියන පෙට්‍රල් ඕනෑවටත් වඩා ඉහිරිලා තියෙනවා. මේ රටේ පාලකයන් විසින් තමන්ගෙ බල වුවමනාවන් වෙනුවෙන් විටින් විට මේ ජාතිවාදය නැමැති පෙට්‍රල් සහිත අපේ ජන සමාජයට ගිනි ඇවිළුවා.

ඉතින් මේ ගැන ජනතාව දැනුවත් කරන්නත්, "සිංහල, දෙමළ, මුස්ලිම් අපට එක්ව ඉන්න ඉඩ දෙන්න" කියන පණිවිඩය පාලකයින්ට ලබා දෙන්නත් අපි මේ දිනය අවස්ථාවක් කර ගන්නවා. ඒ නිසා අපි මෙවර වැඩසටහන සති දෙකක් පුරා පවත්වන්න සූදානම් වෙලායි ඉන්නේ. ඒකෙදි කවිය, ගීතය සහ චිත්‍රපට යන කලා ක්ෂේත්‍රයන් ආවරණය කරමින් කලා විචාර සහ සංවාද වැඩසටහන් කිහිපයකුත් සිංහල සහ දෙමළ මාධ්‍යයන්ගෙන් වෙන වෙනම දේශන ද්විත්වයකුත් පවත්වන්න අපි කටයුතු සූදානම් කරලා තියෙනවා. ඒ නිසා ඒ වැඩසටහන්වලට සම්බන්ධ විය හැකි ආකාරය ගැන අපේ "Syulanka" ෆේස්බුක් පේජ් එක හරහා ඉදිරියේදී ඔබව දැනුවත් කරන්නත් අපි බලාපොරොත්තු වෙනවා.

**භේදයකින් තොරව සහෝදරත්වයෙන් ජීවත් වීමට අපේ රටේ තාරුණ්‍යය දක්වන කැමැත්ත ගැන ඔබේ අදහස මොකක්ද?**

මෙහෙමයි. මිනිස්සු උපතින්ම කැමති සාමූහිකත්වයටයි. ඒත් මේ සමාජ ක්‍රමය තුළ ඉන්න පාලකයො ඊට කැමති නැහැ. මොකද ඔවුන් කැමති ජනතාව බෙදී දුර්වල වෙනවටයි. කොහොමත් මේ සිස්ටම් එක ඇතුළෙ මිනිස්සුන්ව පුහුණු කරවන්නෙම තනියම ගොඩ යන්නයි, තමන්ගේ කියන දේවල් ගොඩදාගන්නයි විතරයි. ඒකෙ ප්‍රතිඵලයක් විදියටත් මේ පාලකයො දෙන ජාතිවාදී, ආගම්වාදී ලුණු ජනතාව නිතරම ගිලිනවා.

අපේ රටේ තාරුණ්‍යය තුළත් අඩුවැඩි වශයෙන් මේ තත්වය දකින්න ලැබෙනවා. ඡන්ද ළං වෙනකොට වැඩි වැඩියෙන් මේ ගැටුම් උත්සන්න වෙනවා. මේක හරිම පිළිකුල්සහගතයි. නමුත් එසේ නොවන විශාල දැනුවත් තරුණ පිරිසකුත් ඉන්නවා. ඒත් ඒ සමහර අය තුළත් තිබෙන නිහඬතාවය විසින් ජාතික සමගිය වෙනුවෙන් තිබෙන සමාජයීය බලපෑම දුර්වල වෙලා තියෙනවා.

**ජාත්‍යන්තර වශයෙන් ගත්තම මේ පිළිබඳව ඇති අත්දැකීම ගැනත් විස්තර කළොත්...**

නිසැකවම වාමාංශික ව්‍යාපාරයන් සියල්ලම පාහේ පිළිගන්නේ ජාතිවාදය වෙනුවට ජාත්‍යන්තරවාදයයි. ඒ අනුව ලොව කොතැනක වුනත් මේ භේදයන් හේතුවෙන් පීඩාවටත් පත්වන ජනතාව වෙනුවෙන් අප අපගේ සහෝදරත්වයේ දෑත් දිගු කරනවා. ඊශ්‍රායල් පලස්තීන ගැටුම ගත්තත් අපි දීර්ඝකාලීනව පලස්තීනුවන් වෙත අපගේ සහෝදරත්වය ප්‍රකාශ කරමින් විවිධ වැඩසටහන් සංවිධානය කරමින් ඉන්නවා.

ඒ වගේම අපි දන්නවා ලෝකෙ කොතැනත් අධිපති පංතිය විසින් තමන්ගේ බල දේශපාලනය වෙනුවෙන් මේ ගැටුම් ඇති කරමින් සහ ඒවා උත්සන්න කරමින් සිටින බව. ඒක ධනපති ක්‍රමයේත් අධිරාජ්‍යවාදයේත් ජාති ලක්ෂණයක්.

කොහොම වුනත් අපේ රටද ඇතුළුව ලොව පුරා වෙසෙන ජනතාව විවිධ අවස්ථාවලදී පැන නගින සමහර සිදුවීම්වලදී මානවවාදය වෙනුවෙන් හඬනගනවා අපි දැක තිබෙනවා. ජෝජ් ෆ්ලොයිඩ් ඝාතනයට එරෙහි රැල්ල ඊට හොඳම නිදසුනක්. ඉතින් ලෝකයේ බොහෝ මිනිසුන් සහ ගැහැණුන් තුළ තවමත් මනුෂ්‍යත්වය ඉතිරිව තිබෙන බව අපට විශ්වාසයි.

**එහෙම නම් මේ ජාතිවාදී, ආගම්වාදී අර්බුදවලට ස්ථිරසාර පිළිතුර ලෙස ඔබ හිතන්නේ කුමක්ද?**

කළු ජූලිය වගේම දිගන ගැටුම් හරහාත් හෙළි වන්නේ අපේ සමාජයේ නිරුවතයි. ඒ වගේම තාවකාලිකව ගිනි නිවිලා තිබුණත් තාමත් මේ බිම ජාතිවාදය නැමැති පෙට්‍රල්වලින් පෙඟිලයි තියෙන්නේ. මේක තවමත් වහා ගිනි ඇවිළෙන සුළු සමාජයක්. ඒ නිසා අපි කොහොම හරි මේ බිමෙන්, මිනිස්සුන්ගේ හිත්වලින් මේ පෙට්‍රල් ටික වාෂ්ප කරවන්න ඕනා. ඒත් ඒකට මේ සිස්ටම් එක ඇතුළෙ කිසිසේත්ම ඉඩක් නැහැ.

> **මිනිස්සු උපතින්ම කැමති සාමූහිකත්වයටයි. ඒත් මේ සමාජ ක්‍රමය තුළ ඉන්න පාලකයො ඊට කැමති නැහැ. මොකද ඔවුන් කැමති ජනතාව බෙදී දුර්වල වෙනවටයි.**

ඒ නිසා පැහැදිලිවම ජාතිවාදයට, ආගම්වාදයට එරෙහිව ජාතික සමගිය වගේම ජාත්‍යන්තරවාදයත්, ආගමික සහජීවනයත්, මානව ප්‍රේමයත් ළඟා කරලිය හැකි එකම සහ ස්ථිර විසඳුම වන්නේ නවීන සමාජවාදයම පමණයි.

අනික අපි කවුරුත් වෛර කළ යුත්තේ ඔය කියන කිසිම භේදයකින් තොරව අපි කාවත් පීඩාවට පත්කරනු ලබන මේ සමාජ, ආර්ථික හා දේශපාලන මොඩලයට විනා අපේම අනෙකාට නොවෙයි. මොකද මිනිස්සු ජාතිකත්වයන් අනුව ආගම් අනුව, කුලගොත් අනුව, ප්‍රදේශ අනුව, ඉතා කුඩා කුඩා කොටස්වලට බෙදෙන්න බෙදෙන්න මේ පාලකයින්ට හරිම ලේසියි අපිව පාගලා දාන්න.

නිකමට කල්පනා කරලා බලන්න, අපේ පොකට් එක හිස් වෙන්නේ අපේ අල්ලපු ගෙදර ඉන්න වෙනත් ආගමක් අදහන, වෙනත් ජාතිකත්වයකට අයිති මනුස්සයා නිසා නෙවෙයිනේ. ඒ වුනාට අපි මොකද කරන්නේ, සත පහක් ඉතිරි නැති ලෙලි ගියපු පර්ස් එක සාක්කුවේ දාගෙන අල්ලපු ගෙදර මනුස්සයගේ පලු අරිනවා.

ඒ නිසා  විශේෂයෙන්ම තරුණ ඔබට, අපට අද දවසේ දී පැවරුණු වගකීමක් තිබෙනවා. අපි මේ තත්වය වෙනස් කළ යුතුයි. එය අපට කළ හැකියි. ඒ සඳහා අපි බෙදී වෙන්වීම වෙනුවට සහෝදරත්වයෙන් ගොඩයන එක Trend එකක් කරන්න ඕනා. ඒ වගේම ප්‍රාර්ථනාවලට විතරක් අපේ ජීවිත සතුටින් පුරවන්න බැරි නිසා අපි මේ සිස්ටම් එක වෙනස් කිරීම වෙනුවෙන් දායක වෙන්නත් ඕනා.

ඒ නිසා මනුෂ්‍යත්වය සමඟ ශිෂ්ටාචාරය දිගේ ඉදිරියට යනවාද නැතහොත් කප්පරක් බෙදීම් හා ගැටුම් සමඟ ශිෂ්ටාචාරයේ අතරමඟ ආපසු හැරී ගල් ගුහාවටම නැවත රිංගනවාද කියා ඔබ තීරණය කරන්න.

FORWARD

සමාජවාදී තරුණ සංගමයේ මධ්‍යම පුවත්පත

464/20, පන්නිපිටිය පාර,
පැලවත්ත, බත්තරමුල්ල.
Tel: 0112076198
Email: syuforwardnews@gmail.com
syulanka@gmail.com
fb:syulanka
web:syusrilanka.com

# මරණය අභිමුඛව සේලයින් දීම

අසාර්ථක ආර්ථික ප්‍රතිපත්තියක් හමුවේ බිඳවැටෙමින් තිබෙන ශ්‍රී ලංකාව යළි ගොඩගත හැකි ක්‍රියාමාර්ගය කුමක්ද? බැසිල් වැන්නන්ගේ පාර්ලිමේන්තු ආගමනයෙන් රටේ ආර්ථිකය ගොඩනැගිය හැකිද? රටේ ජනතාව වෙත එල්ල වී ඇති පීඩනයන් මුදවාලිය හැකිද? මුහුණු මාරු කිරීමත්, අලුත් බලාපොරොත්තු හැදීමත්, සුපර් මෑන්ලා කෙරෙහි විශ්වාසය තැබීමත් ශ්‍රී ලාංකීය ජනතාව දිගින් දිගටම කරගත් වරද්දා ගැනීමකි. බැසිල්ගේ පුනරාගමනය යනු ශ්‍රී ලාංකීය ජනතාව නැවත වරක් ස්වයං තෘප්තතාවයට පත් කිරීමකි.

රටේ ආර්ථිකයත් රටේ සමස්ත වගකීමෙනුත් 3/4ක් දැන් රාජපක්ෂලා සතුය. දැන් මේ රට පාලනය කරන්නේ රාජපක්ෂලාය. කැබිනට් ඇමතිවරු යනු රූකඩයන්ය. මේ පසුගාමී ධනවාදයේ ස්වභාවයයි. සවිඥානික නිර්ධන පන්තියක් දැන් අපට අවශ්‍යයය. මහජනතාවගේ විරෝධය ගොඩනැගිය යුත්තේ රාජපක්ෂලාට නොව එකම විදියේ පාලන තන්ත්‍රයක් ගෙනියන, මුහුණු වෙනස් කරමින් එකම දේ කරන, එකම පංතියේ පාලක කණ්ඩායමක් මේ රට පාලනය කිරීමට එරෙහිවය.

ජනතාව තලා පෙලන, පීඩනයට පත්කරන පාලකයන්ට එරෙහිව නැගී සිටින ගොවියන්, කම්කරුවන්, ශිෂ්‍යයන්, වෘත්තීය සමිති නායකයන්, සමාජ ක්‍රියාකාරිකයින්, දේශපාලන ක්‍රියාකාරිකයින් මර්දනය කිරීමටත්, අත්අඩංගුවට ගැනීමටත්, යුධ හමුදා කඳවුරුවල ගාල් කිරීමටත් මේ ආණ්ඩුව ගන්නා ක්‍රියාමාර්ගය හුදු රාජපක්ෂවාදීන්ගේ ආරක්ෂාව සඳහා ගන්නා ක්‍රියාමාර්ගයක් පමණක් නොව සමස්ත ධනපති පංතියේම ආරක්ෂාව වෙනුවෙන් ගන්නා ක්‍රියාමාර්ගයකි. කොතලාවල පනත ගෙන එන්නේද බිඳවැටෙන ධනවාදී පාලනයට සේලයින් දීම සඳහාය. මරණාසන්න ලෙඩෙකුට සේලයින් දී සුව කළ නොහැක. යම් අස්වැසිල්ලක් ලැබුණද නිත්‍ය ලෙසම ඔහු මිය යනු ඇත.

නිර්ධන පංතියේ මිනිසුන් වන අප පටු සීමාවන් යටතේ වියුක්තව සටන් කරනවා වෙනුවට සංයුක්ත සටනක් ආරම්භ කළ යුතුය. නිර්ධන පාංතික බලයක් වෙනුවෙන් එම සටන මෙහෙය විය යුතුය. ඒ වෙනුවෙන් මුළු සමාජයම සංවිධානය කිරීමේ අත්නොහැරිය හැකි වගකීමක් තරුණයන් සතුය. ඒ වෙනුවෙන් තරුණයන් මේ මොහොතේ ඉටු කළ යුතු කාර්යය කළයුතුව ඇත. ජයග්‍රහණය හෝ පරාජය මත එය තීන්දු නොකළ යුතුය.

ජූලි 04

## ගොවියන්ට ඇති-ස්සාවලට නැති සර්ගේ නීතිය...



තම වගාවන් කරගෙන යාමට පොහොර නොමැතිව ගොවීන් මහපාරට බැහැලා. ගොවියන් කියන්නේ තම වගාව කරගෙන යෑමට සුදුසු මොනවහරි පොහොරක් ලබාදෙන්න කියලයි. එයින් ඇඟවෙන්නේ නෑ, කාබනික පොහොර එපා කියලා. දැන් ආණ්ඩුව ගෙනයන කාබනික පොහොර ව්‍යාපෘතිය කිසි සැලසුමක් ඇතිව ක්‍රියාත්මක නොකරන නිසා තමයි ගොවියන් අසරණවෙලා ඉන්නේ. ආණ්ඩුව ගන්න කලින් නම් ගෝඨාභය මහත්තයා කිව්වේ නිකන් පොහොර දෙනවා කියලා. ඒකට බහුතරයක ගොවියන් අහුවුණා කිවුවොත් නිවැරදියි. ඒ නිසා තමන් හදාගත්තු ආණ්ඩුවට එරෙහිව ගොවියන්ට සටන් කරන්න සිද්දවෙලා තියෙන්නේ . නමුත් කොරෝනා නීති මුවාවෙන් සටන් කරන ගොවි නායකයෝ සහ ගොවීන් අත්අඩංගුවට ගැනීමේ ක්‍රියාවලියක් ආරම්භ කරලා. මේ පිළිබඳව බුකිය පුරා පෝස්ට් පළවෙලා තිබුණා. ඒ එක්කම ආණ්ඩුව සම්බාහන මධ්‍යස්ථාන, ස්පා ආයතන පවත්වාගෙන යන්න අවසර දීලා. බුකීවාසීන් ප්‍රශ්න කරන්නේ උද්ඝෝෂණවල මීටරේ බලන ආණ්ඩුව, සම්බාහන මධ්‍යස්ථානවල මීටරේ බලන්නේ අලුත් ඒකකයකින්ද කියලයි.

ජූලි 05

## ස්මාර්ට් ෆෝන්එක වෙනුවට ස්මාර්ට් පරෙවියා ළඟදීම



බුකිය පුරා අලුත් පරෙවියෙක් ගැන පෝස්ට් ෂෙයාර් වෙනවා. ඊළඟට ෆෝන්එක වෙනුවට එන අලුත්ම ඩිවයිස් එක තමයිලු ස්මාර්ට් පරෙවියා. දැන් බුකියේ ඈයෝ පරෙවියා ගැන අලුත් කතා, පරණ කතා රස කරකර දෙනවා. 2025 පරෙවියා මැසේජ් රැගෙන යන විදිය, ඉමේජ් ෂෙයාර් කරන විදිය, වීඩියෝ ෂෙයාර් කරන විදිය, පරෙවියාගේ මෙමරිය, පරෙවියාගේ ඩේටා ට්‍රාන්ස්ෆර් කරන වේගය වැනි කතා ගොඩයි. ටිකක් හොයා බැලුවා එකපාරටම බුකියට පරෙවියෙක් ආවේ කොහොමද කියලා. බැලින්නම් ඩේටාබේස්වලින් වැඩකරන් ආපු අපේ ජනාධිපති සර් ෆෝන්, ටැබ් ආදී ඉලෙක්ට්‍රික් බඩු ඉන්පෝර්ට් කිරීම නතර කරන්න යනවලු. ලෝකයේ කෙටිකාලයක් තුළ ජෝකර් කෙනෙක් වුණු ජනාධිපති අපේ ජනාධිපති කියලයි හිතන්නේ. මොකද සර් ලංකාව ආපහු ගල් යුගයට අරගෙන යන සීන් එකක් තියෙන්නෙ කියලා තමයි සර්ට වෝට් කරපු කෙල්ලෝ කොල්ලෝ දුකෙන් වුණත් කියන්නේ.

ජූලි 08

## කොතලාවලින් පටන් ගන්න මිලිටරීකරණය



කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාල පනත ගෙන ඒමත් සමඟ රටපුරා පාසල් හා විශ්වවිද්‍යාල ශිෂ්‍යයින්, විශ්වවිද්‍යාලවල ආචාර්ය මහාචාර්යවරුන්, ගුරුසංගම් හා දෙමාපියන්ගේ දැඩි විරෝධයක් දක්වමින් සිටිනවා. ඉගෙනගැනීමේ අයිතිය කියන්නේ මිනිසෙකුට තිබෙන පරම අයිතියක්. නමුත් අපේ රටේ නිදහස් අධ්‍යාපනයට පහුගිය ආණ්ඩු විසින් විඩෙන් විඩ ගෙනආ අණ පනත් හේතුවෙන් මේ වන විට ඒ නිදහස් අධ්‍යාපනය අහිමිවෙමින් තිබෙනවා. රටේ රාජ්‍ය විශ්වවිද්‍යාල සංවර්ධනය කරනවා වෙනුවට ආණ්ඩු කළේ පුද්ගලික විශ්වවිද්‍යාල ආරම්භ කිරීමයි. අද මේ කතාවෙන කොතලාවල ආරක්ෂක වි.වි. පනතත් එවැනි එකක්. ඒ විතරක් නෙවෙයි මෙම පනතේ ඉතා බරපතල තත්වය වනුයේ මෙම විශ්වවිද්‍යාලය මිලිටරීකරණයට ලක්කිරීමට අණපනත් තිබීමයි. මෙහෙම ගියොත් අපේ රටේ දුප්පත් අම්මලා තාත්තලාගේ දරුවන්ට සොරිම තමයි.

ජූලි 07

## කැහි ගෑණි වෙනුවට හොටු ගෑණි අරන් හරියනවද?

මීට වසර දෙකකට ආසන්න කාලයකට කලින් තමයි ජනාධිපතිවරණය තිබුණේ. එහිදී ගෝඨාබය රාජපක්ෂ මහතාට සහය දෙන කණ්ඩායමේ මතවාදය වුයේ, 'පාර්ලිමේන්තුවේ 225ම



එපා. බහුතරයක් වියතුන්ගෙන් යුතු පාර්ලිමේන්තුවක් තමා අපේක්ෂාව. මහින්ද රාජපක්ෂ අප්සට්, ඒ නිසා ගෝඨාබය ආවොත් හොඳට කරයි. ඒ නිසා රට රැකගන්න තිබෙන අන්තිම අවස්ථාව මේක. ගෝඨාබය දිනෙව්වොත් තමයි රටටම එක නීතියක්, හොරු නැති පාර්ලිමේන්තුවක් බලාපොරොත්තු වෙන්න පුලුවන් වෙන්නේ.' ඉතින් ඒ නිසා තමයි අප්සට් මහින්ද රාජපක්ෂට වඩා හොඳටම කරන ගෝඨාබය දිනවන්න 69ලක්ෂයක ජනතාවක් ඡන්දය දුන්නේ. දැන් වසර දෙකකට ආසන්න කාලයක් ගෙවී ගොස්. දැන් ඒ අය කියන්නේ, 'ගෝඨාබය අවුල්, ගෝඨාබයට මේක කරගන්න බෑ. සුපිරි වැඩ්ඩා තමයි බැසිල් රාජපක්ෂ මහතා. එනිසා එතුමාව පාර්ලිමේන්තුවට ගේන්න ඕන. එතුමාට මේක කරන්න පුළුවන්.' ඔහුට බැරිවුණොත් යළිත් 'රාජපක්ෂගේ දරුවෙක් ආවොත් තමයි ගොඩදාන්න පුලුවන්' කියන තර්කය බොහෝවිට එන්නත් පුලුවන්. ලාංකිකයන් විදියට අවුරුදු 73ක්ම කළේ අරයා වෙනුවට මෙයා, මෙයා වෙනුවට අරයා ගෙනල්ලා පරම්පරා ගණනාවක් ලෝකයට ණයකාරයෝ කළ එක විතරයි. එනිසා කැහි ගෑණි වෙනුවට හොටු ගෑණි අරන් වැඩක් නැහැ. මහින්ද, ගෝඨා, බැසිල්, නෙවෙයි වෙන මොකා ආවත් රටට මැජික් කරන්න බැරි බව දැන් ඔප්පුවෙලායි තියෙන්නේ. මේ ආර්ථිකය ක්‍රමය, මේ සමාජ ක්‍රමය වෙනස් කරන්නේ නැතිව තනි තනි පුද්ගලයින් අවුරුදු 100-200ක් ගෙනාවත් මේක ගොඩදාන්න බැරිබව නම් ස්ථිරයි.

Sports




# පළමු තරඟය ජූලි 14

ශ්‍රී ලංකාව හා ඉන්දියාව අතර එක්දින හා T20 තරඟාවලිය ජූලි 14 දින සිට ආරම්භ වේ.





# නිමාලි ටෝකියෝ ඔලිම්පික් වරම් ලබයි

2020 ටෝකියෝ ඔලිම්පික් උළෙල නියෝජනය කිරීම සඳහා නිමාලි ලියනාආරච්චි සමත් වී තිබේ. ඒ අනුව ඇය මෙවර ඔලිම්පික් උලෙළේ දී මීටර් 800 ධාවන ඉසව්වෙන් ශ්‍රී ලංකාව නියෝජනය කිරීමට නියමිතයි.

# කියුබාවට රන් කුසලානය අහිමි වෙයි

එක්සත් ජනපදය විසින් ක්‍රීඩකයින් කිහිපදෙනෙකුට වීසා ලබාදීම ප්‍රතික්ෂේප කිරීමෙන් පසු කියුබාවේ පාපන්දු කණ්ඩායම රන් කුසලානයෙන් බැහැර කරන ලදී. මෙම කණ්ඩායම නිකරගුවාවේ මාසයක් තිස්සේ පුහුණුවීම්වල යෙදී සිටියද ෆ්ලොරිඩාවේ ආරම්භක වටයට සහභාගී වීමට එක්සත් ජනපදය විසින් වීසා බලපත්‍ර නිකුත් කර නොමැත.




# වසර 25කට පසු මීටර් 100ට ලාංකිකයෙක්!

වසර 25කට පසු මීටර් 100 ඉසව්ව වෙනුවෙන් ශ්‍රී ලාංකික ක්‍රිඩකයෙක් ඔලිම්පික් වරම් ලබා ඇත. මීටර් 100 දකුණු ආසියානු වාර්තාවට හිමිකම් කියන ශ්‍රී ලංකාවේ යුපුන් අබේකෝන් ඔලිම්පික් ක්‍රීඩා උළෙලට එලෙස සුදුසුකම් සපුරාලූ ක්‍රිඩකයායි. මීටර් 100 ලෝක ශ්‍රේණිගත කිරීම් අනුව 51 වන ස්ථානයේ පසුවන යුපුන් අබේකෝන් ඔලිම්පික් ක්‍රීඩා උළෙල සඳහා සහභාගී වන ක්‍රිඩකයින් 56 අතරින් 45 ස්ථානයේ රැඳී සිටී.

1996 ඇට්ලන්ටා ඔලිම්පික් උළෙල නියෝජනය කළ චින්තක ද සොයිසාගෙන් වසර 25කට පසු ඔලිම්පික් උළෙල මීටර් 100 නියෝජනය කරන පළමු ශ්‍රී ලාංකික ක්‍රිඩකයා වන්නේ යුපුන් අබේකෝන්ය.

# ජාතික ආරක්ෂාව අනතුරේ!

වර්තමාන පාලනය බලයට පත්වූයේ ජාතික ආරක්ෂාව තහවුරු කරන බවට පුරසාරම් දොඩමින්ය. නමුත් පසුගියදා ඛනිජ තෙල් නීතිගත සංස්ථා පනත වෙනස්කිරීමට හදිසි කැබිනට් යෝජනාවක් අනුමත වන්නේ අපේ රටේ ජාතික ආරක්ෂාව බරපතල අනතුරකට හෙලමිනි. මෙම යෝජනාව හරහා ඛනිජ තෙල් අපනයනය, ප්‍රවාහනය, ගබඩාකිරීම, පිරිපහදුව හා බෙදාහැරීම පිළිබඳ තීරණය කිරීමේ තනි අයිතිය විෂයභාර ඇමතිවරයාට හිමිවේ. මේ සංශෝධනයට හේතු ලෙස ඇමතිවරයා ප්‍රකාශ කරන්නේ ඛනිජ තෙල් සංස්ථාව පාඩු ලබන බවයි. ඔහුට අනුව මෙම පාඩුව කෝටි 66000කි. නමුත් මෙලෙස පාඩු ලැබීම පිළිගත නොහැකි සත්‍යයකි. මන්දයත් ඛනිජ තෙල් නීතිගත සංස්ථාව ඉතිහාසයේ විශාල ලාභයක් ඉපයූ ආයතනයක් වන නිසාය.

1969 වසරේ සපුගස්කන්ද පිරිපහදුවෙන් ලබාගත් ආදායමෙන්, තෙල් ආනයනය සඳහා ගිය වියදමෙන් 25%ක් ඉතිරි කරගැනීමට හැකිවිය. එමෙන්ම කොළොන්නාවේ ලිහිසි තෙල් යන්ත්‍රාගාරයෙන් ඝන තාර, ඉටිපන්දම්, පොහොර ඇතුළු අතුරු ඵලයන් රැසක් නිෂ්පාදනය කිරීමට හැකිවිය. මෙමගින් ලාභය විශාල වශයෙන් වැඩිවිය. මෙහි ලාභයෙන් පමණක් එදා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවට නැව් 3ක් මිලදීගැනීමට හැකිවිය.

1976දී තෙල් ආනයනය කිරීමට වැයවූ මුදලින් 45%ක් ලිහිසි තෙල්, ඝන තාර, ඉටිපන්දම්, පොහොර වැනි අතුරු නිෂ්පාදන අපනයනයෙන් උපයාගැනීමට හැකිවන තරමට අසීමිත ලාභ ලබන ශක්තිමත් ආයතනයක් ලෙස ඛනිජ තෙල් නීතිගත සංස්ථාව පැවතුණි. එමෙන්ම මෙම කර්මාන්ත ශාලා නිසා විශාල රැකියා ප්‍රමාණයක්ද උත්පාදනය විය. මේ නිසා ආර්ථිකයට විශාල දායකත්වයක් සැපයීමට ඛනිජ තෙල් නීතිගත සංස්ථාවට හැකිවිය.

මෙසේ ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව රාජ්‍ය ඒකාධිකාරයක්ව පැවතිණි. නමුත් 1987දී එක්සත් ජාතික පක්ෂ පාලනය විසින් අත්තනෝමතිකව අත්සන් තැබූ ඉන්දු-ලංකා ගිවිසුම මගින් ත්‍රිකුණාමලයේ ඇති තෙල් ටැංකි ඉන්දියාවට ලබාදීමෙන් මෙම ඒකාධිකාරය බිඳගත්තේය. ඉන්පසුව 2002දී එ.ජා.ප පාලනය විසින් ගෙන ආ 2002 අංක 33 දරණ ඛනිජ තෙල් නිෂ්පාදන විශේෂ විධිවිධාන පනත මගින් රජය සතු තෙල් ඒකාධිකාරය ඉන්දියානු අයි.ඕ.සී. සමාගමට පැවරුණි. ඒ අනුව 2003දී තෙල් ආනයනය, ගබඩාකිරීම හා බෙදාහැරීමේ බලය අයි.ඕ.සී. සමාගමට අවුරුදු 20ක කාලයක් සඳහා ලබාදීමට එම පාලකයෝ කටයුතු කළහ. මෙසේ අප රට සතු තෙල් ඒකාධිකාරයෙන් 20%කට වැඩි ප්‍රමාණයක් ඉන්දියාව සතු කළෝය. දැන් හදිසියේම නැවතත් ඛනිජ තෙල් නීතිගත සංස්ථා පනත වෙනස් කිරීමට සැරසෙන්නේ මෙම ඒකාධිකාරය තවත් අඩපණ කිරීමේ අරමුණින්ය. සංස්ථාව පාඩු ලබා ඇත්තේ පනතේ වරදින් නම් පනත සංශෝධනය කිරීම වරදක් නොවේ. නමුත් පනතේ වැරදි ඇත්නම් ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව ඉතිහාසයේ අධික ලාභයක් ලබන ආයතනයක් වූයේ කෙසේද? වරද ඇත්තේ පනතේ නොව, අදූරදර්ශී දේශපාලන ආර්ථික දැක්මේය. පාලකයින්ගේ පටු පෞද්ගලික උවමනාවන්වලය. මේ සැරසෙන්නේද එවැනි පටු උවමනාවන් ඉෂ්ට කරගැනීමටය.

01. අයි.ඕ.සී.යට අවුරුදු 20ට ලබාදුන් බලපත්‍රය 2023දී අවසන් වන අතර එය අලුත් කරගැනීමට.

02. ත්‍රිකුණාමලයේ තෙල් ටැංකි ඉන්දියාවට පවරාගැනීමට හා එහි තෙල් පිරිපහදුවක් ස්ථාපිත කරගැනීමට ඉන්දියාවට අවසර දීමට.

03. දැනට හම්බන්තොට වරායේ නැව් තෙල් අංශයක් පවත්වාගෙන යන සිනෝපෙක් ආයතනයට එහිම පිරිපහදුවක් ස්ථාපනය කිරීමට අවසර ලබාදීමට.

04. එමෙන්ම වෙනත් ඕනෑම බහුජාතික සමාගමකට අපේ රටේ තෙල් ආනයනය, ගබඩාකිරීම, පිරිපහදුව හා බෙදාහැරීමට ඉඩ ලබාදීමට.

මෙවැනි යටි අරමුණු මේ පනතේ ඇත්ත උවමනාවන්ය. මේ කරන්නේ ලෝක බල දේශපාලනය කලමනාකරණය කිරීමේ ඊනියා ක්‍රියාමාර්ගයි. මෙමගින් අපේ රටේ ජාතික ආරක්ෂාව විශාල අනතුරකට හෙලනවා සේම රටේ ආර්ථිකයටත් පාඩු ගෙනදේ.

01. 2023දී ඉන්දියානු අයි.ඕ.සී. සමාගමේ බලපත්‍ර අහෝසි වී ඛනිජ තෙල් ආනයනය, ගබඩාකිරීම, පිරිපහදුව හා බෙදාහැරීමේ ඒකාධිකාරය නැවත රජය සතුවීම වැළැක්වීම.

02. අයි.ඕ.සී. පමණක් නොව තවත් බහුජාතික සමාගම් සමඟ තරඟකිරීමට ඛනිජ තෙල් සංස්ථාවට සිදුවීම.

03. චීන, ඉන්දියානු හා ඇමරිකානු සමාගම් මගින් ස්ථාපිත කරන නව පිරිපහදු සමඟ අපේ සපුගස්කන්ද අබලන් පිරිපහදුවට තරඟකිරීමට නොහැකි වීම.

04. අපේ රටේ බලශක්තිය වෙනත් රටවල් අතට පත්වීමෙන් අපේ රටේ ජාතික ආරක්ෂාව විශාල අනතුරකට හෙලීම.

05. ඇමතිවරයාගේ තනි අයිතිය මත(තනි පුද්ගලයෙකුගේ) තීරණ ගැනීමට හැකිවන ලෙස පනත වෙනස් කිරීමද ජාතික ආරක්ෂාවට බරපතල තර්ජනයකි.

මෙලෙස අනතුරට හෙලන්නේ අපේ රටේ ජාතික ආරක්ෂාවයි. ජාතික ආරක්ෂාව යනු රට වටේ තුවක්කු තියාගත් සෙබලුන් සිටීම, පාරවල්වල මාර්ග බාධක යෙදීම හෝ හමුදා නිලධාරීන් සිවිල් ආයතනවල ප්‍රධානීන් කිරීම හෝ පමණක් නොවන බව වටහාගත යුතුය. රටේ ආර්ථික ස්වාධීනත්වය ජාතික ආරක්ෂාවේදී ප්‍රධාන වේ. ඛනිජ තෙල් මෙහිදී ප්‍රධාන වේ. මන්දයත් වාහන ගමනාගමනයට පමණක් නොව කර්මාන්ත, බලශක්තිය විදුලි බල නිෂ්පාදනය වැනි සියල්ල මේ හා බැඳෙන බැවිනි. මේ සියල්ල එක් පුද්ගලයෙකුගේ පෑන් ඉරකට යටත් කර, බහුජාතික සමාගම්වල ඕනෑඑපාකම්වලට හිසනමා, අපේ ආර්ථිකය හා රටේ ජාතික ආරක්ෂාව බරපතල අනතුරකට හෙලන මෙම ඛනිජ තෙල් නීතිගත සංස්ථා පනත් සංශෝධනයට එරෙහිවීම අප කාගේත් වගකීමක් වන්නේය.





# විසිඑක්වන සියවසේ එඬේර මිනිසුන්

# NOMADLAND

වනාන්තර, ගස්බෙන, ගල්ගුහා හරහා මිනිසුන් සියවස් ගණනාවක් පසුකරමින් වර්තමානයට පැමිණ ඇත. විශේෂ ආරක්ෂක පද්ධති, කායවර්ධන මධ්‍යස්ථාන, නානතටාක, රඟහලවල් පමණක් නොව අහස්යානා ගොඩබෑම සඳහා සකසන ලද වහලවලින් පවා සමන්විත අතිසුඛෝපභෝගී නිවාස සදමින් තම හිසට සෙවණක් සලසාගන්නා මිනිසුන්, දැන් දැන් වෙනත් ග්‍රහයන් මතද නිවාස සෑදීම අරඹමින් ඇත. කාරණය නම්, මිනිසා තනි තනිව එකී අනාගතයට ගොඩබැසීමය. සාතිශය සුලුතරයක් ජීවත්වීමට වෙනත් ග්‍රහයෙක්, වෙනත් මහද්වීපයක්, රටක් හෝ ඉඩමක් සොයද්දී බහුතරයක මිනිසුන් විසිඑක්වන සියවසේදීත් හිසට සෙවණක් නොමැතිව මහපාරේ ජීවත්වීමය.

Nomadland-2020 චිත්‍රපටය බිහිවන්නේ අතිදියුණු යැයි සම්මත මිනිසාට එලෙස මගහැරුණු සිය ප්‍රජාව දෙස නැවතත් හැරී බලන්නට ඉඩ සලසමිනි. Jessica Bruderගේ Nomadland- Surviving America in the Twenty-first century නම් ග්‍රන්ථය පදනම්කරගනිමින් නිර්මාණය වූ මෙම චිත්‍රපටයේ තිරරචනය, සංස්කරණය හා නිෂ්පාදනය එහි ප්‍රධාන චරිතය හොබවන Frances McDormandගේ වන අතර අධ්‍යක්ෂණය චීන ජාතික Chloe Zhao විසිනි.

2021 Academy awardsහි වසරේ හොඳම චිත්‍රපටය සඳහාද, හොඳම නිළිය මෙන්ම හොඳම අධ්‍යක්ෂණය සඳහාද ඔස්කාර් සම්මානයට පාත්‍රවන්නට මෙම සිනමා සිත්තමට හැකිවිය. ඉතිහාසයේ පළමුවතාවට ආසියානු කාන්තාවක් හොඳම අධ්‍යක්ෂවරියක ලෙස ඔස්කාර් සම්මානයක් ජයගැනීමද මෙහි සුවිශේෂත්වයකි. හොලිවුඩයෙන් ඔබ්බට මුලු ලොවකගේ අවධානයට පාත්‍ර වුණු, සිනමා උළෙලවල් රැසකදී සම්මාන රැසකින් පිදුම්ලද නිර්මාණක් වන Nomadland ලොව ධනවාදයේ ඉණිපත්තේ සිටින ඇමරිකා එක්සත් ජනපදය තුළ හිසට සෙවණක් නොමැතිව පීඩාවිඳින මිනිසුන් පාදක කරගනිමින් නිර්මාණය වූවකි.

“මම හැම තැනකම රස්සා හෙව්වා. ඇප්ලිකේෂන් දැම්මා.. මම පල්ලෙහටම වැටුණා. දිවිනහගන්නත් හිතුවා.. මට එතකොට 62කට කිට්ටුයි. මම ඉන්ටනෙට් එකට ගියා මගෙ සමාජ ආරක්ෂණ ආධාරෙ බලන්න. ඒකෙ තිබුණෙ ඩොලර් 550යි.. ෆර්න්,මම මුලු ජීවිතකාලෙම වැඩ කළා. අවුරුදු 12 ඉඳන් රස්සා කරන්නෙ. දූලා දෙන්නෙක් උස්මහත් කළා මම. හිතාගන්න බැරිවුණා දෙන ගාණ දැක්කම.”

ලොව ආර්ථික බලවතා වුවද ඇමරිකාව සිය පුරවැසියන්ගේ මූලිකම අවශ්‍යතා හෝ සැපිරීමට අසමත්වී ඇත. ලොව විද්‍යාවේ හා තාක්ෂණයේ ඉහළම ජයග්‍රහණයන් මුදුන්පත් කරගත් ඇමරිකාවට තම පුරවැසියන්ගේ ජීවිත සුරක්ෂිතකිරීමට නොහැකිවී ඇත. සරලවම කියතොත්, ධනවාදයට මිනිස් ජීවිත අමතක වී ඇත...

හාවර්ඩ් විශ්වවිද්‍යාලයේ Joint center for housing studiesහි 2014 පර්යේෂණ දත්ත වාර්තාව අනුව 2012 වසරේදී ඇමරිකාවේ නිවාස නොමැති පුද්ගලයින් ගණන මිලියන 7.4කි. ඉන් මිලියන 1.2ක්ම පාසල් දරුවන් විය. මෙසේ නිවාස නොමැතිකමට ඔවුන් හේතු ලෙස පෙන්වාදෙන්නේ කුලී නිවාස හිඟකම, රැකියා විරහිතභාවය, දිළිඳුබව සහ මානසික සංකූලතාය. කිසිදු නිවාසයක් නොමැති මිනිසුන් මෙන්ම 2012 වසරේදී මිලියන 43ක් වූ කුලී නිවාසවල ජීවත්වන ඇමෙරිකානුවන්ටද අත්වී ඇත්තේ ඊට නොවෙනස් කටුක ඉරණමකි. සෑම කුලී නිවැසියන් 4න් එකෙකුටම තම සමස්ත ආදායමෙන් අර්ධයක්ම නිවාස කුලිය සඳහා වෙන්කිරීමට සිදුව ඇති අතර එහි බලපෑමද ජාතිකත්ව මත, හමේ පැහැය මත විචලනය වීම ඛේදවාචකයකි.

නිවාස නොමැතිබව මෙන්ම, ඇමෙරිකානුවන් අත්විඳින විරැකියාව, දිළිඳුබව, ආර්ථිකමය අස්ථාවර බව Nomadland මෙලෙස දිගහරින්නේ මේ සමාජ ක්‍රමය තුළ ඇමරිකාව හෝ ලොව කිසිදු රටකට හෝ මිනිස් ජීවිත වෙනුවෙන් විසඳුම් නොමැති බව අවධාරණය කරමිනි.

“RTR යනු මග සැරුම්-ජීවිතවලට ආධුනිකයන් සඳහා වන පුහුණු කඳවුරක්. Rubber Tramp Rendezvous(රථවාසී දිළින්ඳන්ගේ හමුව) තියෙන්නෙ ඇරිසෝනා ප්‍රාන්තේ කාන්තාර මැද්දෙ. ෆර්නුත් එනවනම්, මං පාර ඇඳලා දෙන්නම්...”

මිනිසුන් මුහුණදෙන ප්‍රශ්නවලට සැබෑ විසඳුම් ලබාදෙනු වෙනුවට තාවකාලික පැලැස්තර යොදමින් සහන සලසන ක්‍රමද ධනවාදය විසින්ම හඳුන්වාදෙන බව මෙම චිත්‍රපටය සූක්ෂම ලෙස කියාදෙයි. ඒ ලාභය සෙවීමට පමණක් දන්නා, එහෙත් මිනිස් ජීවිත ඉදිරියේ නිරුත්තරවන ධනවාදයේ අසාර්ථක බව නැවත නැවතත් තහවුරු කරමිනි. එබැවින් Nomadland යනු බහුතරය ධනවාදී වූ ලෝකයක ජීවත්වන අප කියවාගත යුතු සුවිශේෂී කලා නිර්මාණකි.

## සරදියෙල්ගේ කොලම

තව රෙකෝර්ඩින්ග් එකක් ලීක් වෙලා. මහරජාගෙයි මල්ලිගෙයි. 2020 ඉලෙක්ෂන් කාලේ තමයි මේක කතා වෙලා තියෙන්නෙ.

“අයියේ, මට වියත්මගේ ගොනෙක් කිව්වා, අද රැස්වීමේදී පොහොර ආපහු 350ට දෙනවා කියන්න කියලා. මං එහෙම කියන්නද? ඒ ගොනා කිව්ව එක මේ ගොන්නු පිළිගනී නේද?”

“නන්දේ, උඹ මෙහෙම කරහං, උඹ කියපන් පොහොර නිකන්ම දෙනවා කියලා. මං කිව්වේ කියපන්කො. මුං එකෙන්ම ලණුව ගිලිනවා.”

“ඒත් අයියේ, ඡන්දෙන් පස්සේ මොකෑ කරන්නේ?”

“උඹ පණ්ඩිත නොවී හිටපන්කෝ. කව්ද බන් දෙන්නේ?. දින්න ගමන් අපේ නඩු ටික බේරග නින්. ඊටපස්සේ කියපන් රසායනික පොහොර හොඳ නැතෙයි, ඒවා දේශද්‍රෝහීයි, කාබනික ඒවා හොඳයි, එව්වා දේශහිතෛෂියි, එව්වා හදාගෙන වගාවට ගහගන්න කියලා. උබේ ඔය වියත්මගේ ගොනෙක්ට ප්‍රොජෙක්ට් එක දීපන්. ඌ ලස්සනට කරයි.”

මේ රෙකෝර්ඩින්ග් එක අහපු සරදියෙල්ට පුදුම අනුකම්පාවක් තමයි මේ රටේ හරක් ගැන දැනුනේ. උන් කාලෙන් කාලෙට මොකෙක් හරි තකතීරුවෙක්ට රැවටෙනවා. පෙළක් හරක් නම් පහුවෙන් පහුවට දුක් වෙනවා. මී හරක් නම් ඒත් හුරේ දානවා.

ඊයේ පෙරේදා රෑ දවාලක මේ ගොන් රැලව ඇමතුවානේ මිස්ටර් ‘ජී. හය කින්ග් පස්ස’ කියන පළවෙනි ගොන් වැසියා. ඒක හරි අපූරු නාට්ටියක්. මහ රෑ අව්ව පායලා. ගොන් වැසියෝ හිතුවා එයා එයාගේ රටේ ඉඳන් කතා කරන්නේ, ඇමරිකාවට දැන් දවල්නේ කියලා. මේන් ටික වෙලාවකින් පිටිපස්සෙන් මහා චෛත්‍ය රාජයෙක් දිස් උනා. ලොකු ශබ්දයක් ආවා. බැලින්නම් රට පුරාම ඉන්න අපේ උපාසක අම්මලා සාදුකාර දීලා.

“පාසල් 10,000කට අපි ෆයිබර් ඔප්ටික් කනෙක්ෂන් දුන්නා.” මේකා කියාපි.

සරදියෙල්ගේ ඇස් ලොකු උනා. මේ සිරිලකේ තියෙන්නෙත් යන්තන් ඉස්කෝල දහදාස් ගාණමයි නේද? මූ අපේ ස්කූල් පීපල්ස්ලව සර්ප්‍රයිස් කරන්න යනවවත්ද? ඇයි යකෝ කොරෝනාවලට ඉස්කෝල වහලා තියෙද්දී මේකා හොරෙන්ම ගිහින් ඉන්ටර්නෙට් හොඳම එකෙන් දීලවත්ද?

ටෙලිවිෂන් එකේ බැලුවොත් ළමයි ගල් උඩ, ගස් උඩ, සෙල්ලම් කොරනවා එහෙම නෙමෙයි ආයිබොවන්ඩ! උන් සිග්නොල් හොයනවා. අලි එද්දී දුවනවා. අම්මලා තාත්තලා අඬනවා සිග්නොල් කණුවක් දාලා දෙන්න කියලා.

ඒ උනාට කවුරුවත් කියන්නෑනේ මෙයා කරපුවා. මෙයා යකෝ හැම ඉස්කෝලෙකටම ඉන්ටර්නෙට් හොඳම එකෙන් දීලනේ. මෙයා තමයි හොඳටම කොළේ. ඒ උනාට මෙයාට කතාව කොලේ ලියලා දීපු එකා දන්නෑ ලංකාවේ තියෙන ඉස්කෝල ගාණ. ඒකයි උනේ.

අනේ ඉතින් සරදියෙල් මොනවා කරන්නද ආයිබෝන්? අර ජෝකර් කියන ඒවා විශ්වාස කොරලා ජහමනයා දුන්නා නොවැ විශ්මකර්මයාට. රට කොරන්න. දැන් ඉතින් උගේ කෝලම් බලබල ඉඳින්!. ඌට විරුද්ධව එළියට බහිනවා එහෙම නෙමෙයි හොන්ද?. බැස්සොත් කරන දේ ජොනී බට්ටා කිව්වනේ. මරලා එල්ලනවලු තට්ට!. අර එක සැරයක් මහ රජාව මරන්න කොටියා එක්ක ජ්ලෑන් ගැහුවා වගේ...

මේවා ඇහෙද්දී සරදියෙල්ට නම් හිනා. කාක් තට්ටට බය වෙන කාක්කෝ නන් ඇති. හැබැයි මේ කොදෙව්වේ සරදියෙල් පන්නයේ මැරෙන්න බය නැති, යුක්තිය, සාධාරණත්වය වෙනුවෙන් ඉස්සරහට එන කොල්ලො කෙල්ලෝ දහස් ගණන් ඉන්න බව ජොනී බට්ටාගේ පස්ස පැත්තේ තියෙන මොලේට තේරුන් නැති උනාට, දන්නෝ දනිත්. ඒ නිසා ජොනී බට්ටෝ! සමිතා නංගිගේ සින්දුවක් අහගෙන පරිස්සමින් ඉන්ට හොඳේ.

නූතන පරපුරේ සරදියෙල්...



# ඩොලර් නෙළන්නට ගිනි තැබූ සාගරයක කඳුළු කතාව

ජෛව විවිධත්වයෙන් අනූන සහ ඉහළ සංචාරක ආකර්ෂණයක් හිමි අප සාගර කලාපය මේ වන විට මිල දන්නා, වටිනාකම නොදන්නා අදූරදර්ශී පාලකයන්ගේ තීරණ හේතුවෙන් පවතිනුයේ අවදානමට ලක්වය. මීට මාස කිහිපයකට පෙර නිව් ඩයමන්ඩ් නමැති තෙල් ප්‍රවාහන නෞකාව අපට අයත් සාගර කලාපයේදී අනතුරට පත්වීම හේතුවෙන් සාගරයේ විශාල තෙල් පැල්ලමක් ඇති වූ අතර ඉන් සිදුවූ පාරිසරික හානියෙන් පාඩම් නූගත් නිසාවෙන් මේ වන විට යළිත් දරුණු පාරිසරික ව්‍යසනයකට මුහුණදෙමින් සිටිමු. ඒ MV- Express Pearl නැමැති රසායනික ද්‍රව්‍ය ප්‍රවාහනය කරමින් තිබියදී ගිනි ගැනීමට ලක්ව විනාශ වූ නෞකාව හේතුවෙනි.

නැවක් අනාරක්ෂිත වුවහොත් සමීපව පිහිටි රටකින් උපකාර ඉල්ලා සිටිය හැකිය. එහිදී එකී උපකාරයේ ස්වභාවය සහ අනතුරට පත් නැවෙන් සිදුවිය හැකි හානිය අනුව උපකාර ලබාදීම ප්‍රතික්ෂේප කිරීමට අදාල රටට හැකි බව ඒ සම්බන්ධ අන්තර්ජාතික රෙගුලාසිවලට අනුව පැහැදිලි වේ. කටාර් සහ ඉන්දියාව විසින් MV- Express Pearl නෞකාව භාරගැනීම ප්‍රතික්ෂේප කළද එම නැවට මෙරට මුහුදු තීරයට ඇතුළු වන්නට මෙරට ආණ්ඩුව ඉඩදුන් අතර එය දරුණු අප්‍රතිකාරී පරිසර හානියකට හේතු විය.

මෙම නැව ගිනි ගැනීමට ලක් වූ නොගැඹුරු මුහුදු කලාපය අතිශය සංවේදී හා ජෛව විවිධත්වය අතින් ඉහළ ප්‍රදේශයකි. නීති විරෝධී ලෙස මෙරටින් ගෙනයාමට තැත් කිරීමේදී අල්ලාගන්නා මුහුදු ජීවීන්ද අත්හරිනු ලබන්නේ මෙම නොගැඹුරු සාගර කලාපයටය. එවැනි සංවේදී හා සුවිශේෂී සාගර කලාපයකට නයිට්‍රික් අම්ල ටොන් 25ක්, පොලිතීන් සහ ප්ලාස්ටික් අඩංගු බහාලුම් 87ක්, යූරියා බහාලුම් 88ක්, කෝස්ටික් සෝඩා බහාලුම් 42ක්, ලිහිසි තෙල් වර්ග සහිත බහාලුම් 30ක්, ඊයම් බහාලුම් 8ක් ඇතුළු මෙතනෝල් වැනි පරිසරයට අහිතකර රසායනික ද්‍රව්‍ය අඩංගු ගිනි ගනිමින් පවතින නැවකට පැමිණීමට ඉඩ දුන්නේ අවම වශයෙන් ඒ සඳහා අවශ්‍ය ගිනි නිවීමේ යාත්‍රා හෝ තෙල්, ප්ලාස්ටික් වැනි දෑ පාවීයාම වැළැක්වීමට ගනු ලබන බෝයාවල් හෝ ප්‍රමාණවත් දැනුමක් අප සතුව නැති පසුබිමකය.

එමගින් අප සාගර කලාපයට සිදුවූ පාරිසරික හානිය අතිමහත්ය. මන්ද මෙම නැවේ තිබූ නයිට්‍රික් අම්ලය යනු ජීවී පටක ඔක්සිකරණයට හේතුවන, ස්පර්ශ වුවහොත් ප්‍රබල පිළිස්සීම් ඇති කරන, තවද ජලයේ pH අගය සීඝ්‍ර ලෙස හීන කරවන අතිශය අන්තරාකාරී රසායනිකයකි. සාගර ජලයේ ධාරිතාව සහ එහි ස්වාරක්ෂක ගුණය නිසා සාගර ජලයේ pH අගය සැලකිය යුතු ලෙස පහළ නොගියද එය තනුක වනතෙක් කාලය තුළ ජීවීන්ගේ පැවැත්මට හානිකර වේ. එමෙන්ම නයිට්‍රික් අම්ලය දහනයේදී උපදින නයිට්‍රස් ඔක්සයිඩ සහ නයිට්‍රජන් ඩයොක්සයිඩ් අම්ල වැසි ඇති වීමට හේතුවකි. ගිලී ගිය බහාලුම් තුළ වන නයිට්‍රික් අම්ලය සාගර පතුලේදී නිදහස් වුවහොත් එය ජලය සමඟ තනුක වනතෙක් මත්ස්‍යයන්, පැළෑටි, කොරල්පර වැනි ජීවීන්ට අතිශය හානිකර ප්‍රතිඵල ගෙන එයි. එමෙන්ම මෙම අම්ලය සාගර ජලයේ ඇතැම් ද්‍රව්‍ය සහ නැවේ පැවති කෝස්ටික් සෝඩා, සෝඩියම් මොනොක්සයිඩ් සමඟ ප්‍රතික්‍රියා කිරීමෙන් සාගර පතුලේ නයිට්‍රේට් මට්ටම වැඩි කර යම් කාල සීමාවකට දරාගත නොහැකි තරමට ඇල්ගී සහ සයනො බැක්ටීරියාවන් වර්ධනය කරන අතර එය මුහුදු ජීවීන්ගේ පැවැත්මට අන්තරායකාරීවේ. තවද නැවේ තිබූ අන්තරායකර සහ මාරක මාත්‍රාව ලෙස වර්ග කළ සෝඩියම් මොනොක්සයිඩ් ජලය හා එක්ව සෝඩියම් හයිඩ්‍රොක්සයිඩ් නම් ප්‍රහල භෂ්මය නිපදවන අතර එයද ජීවීන්ගේ පැවැත්මට අතිශය හානිකර වේ.

තවද මෙම නැව ගිනි ගැනීම හේතුවෙන් සිදු වූ දීර්ඝ කාලීන හානිය වනුයේ ඉන් පිටවූ ප්ලාස්ටික් බිඳිති හෙවත් Plastic palletsh. ලෝකය පුරා සාගර දූෂණයට ප්‍රබලම හේතුව වනුයේ ප්ලාස්ටික් කැබලිය. මෙම නැවේ ප්ලාස්ටික් බිඳිති කිලෝග්‍රෑම් 26000ක් පැවති බව සඳහන් වේ. පවතින නිරිතදිග මෝසම් සුළං හේතුවෙන් මේ වන විට දික්වැල්ල සහ මීගමුව දක්වා වෙරළ තීරයට ඒවා ගොඩ ගසමින් තිබේ. මේවා පාවෙමින් ගොස් කොරල්පර, වැලිපර මෙන්ම ගල්පරවල රැඳෙන අතර එමගින් ඒවායේ පැවැත්මට තර්ජනයක් ඇතිවේ. විශේෂයෙන්ම මෙම ප්ලාස්ටික් බිඳිති මත්ස්‍යයින් ඇතුළු සාගර ජීවීන් විසින් ආහාරයට ගැනීම සහ ඒවා ඔවුන්ගේ කරමල්වල තැන්පත් වීම නිසා මියයාමේ අවදානමට ලක්ව තිබීම ධීවර කර්මාන්තයද අනතුරට හෙලීමකි. එමෙන්ම සාගරයට මුසුවූ මෙම අන්තරායකාර රසායනික ද්‍රව්‍ය සහ ප්ලාස්ටික් බිඳිති ආහාර දාමයන් ඔස්සේ මිනිසුන්ගේ ශරීරයටද ඇතුල් විය හැකිය. මේවා වියෝජනය වීමට වසර 25කට අධික කාලයක් යන අතර ඒ සඳහා වැය වනුයේ සාගර ජලයේ ඔක්සිජන්ය. එමගින් සාගර ජලයේ ඔක්සිජන් ප්‍රතිශතය පහළගොස් මත්ස්‍යන් විශාල ගණනින් එකවර මිය යා හැකිය. විශේෂයෙන්ම මෙමගින් මීගමුව කලපුවේ ලවණ පරිසර පද්ධතියට දැඩි හානි සිදුවිය හැකි බවටද පරිසරවේදීන් අවධාරණය කර ඇත. මේ වන විටත් වෙරළ තීරයට ගොඩගසා ඇති ප්ලාස්ටික් බිඳිති යම් පමණකට ඉවත් කළ හැකි වුවද රසායනික හේතුවෙන් කළු පැහැ වූ වෙරළ තීරය යථාවත් වීමට තවත් දීර්ඝ කාලයක් ගතවනු ඇත. මේ විනාශයේ හානිය මෙතරම් බරපතල වුවද පාලකයන් බලා සිටිනුයේ විශාල වන්දියක් ලබා ගැනීමටය. අප සමුද්‍ර ආරක්ෂණයට අදාළ අන්තර්ජාතික සම්මුති 11කට පමණ අත්සන් කළද ඒවා මෙරට බලාත්මක කිරීමට අවශ්‍ය නීති සකසා නැති බැවින් සහ මෙවැනි හානියකදී උපදෙස් ලබාදෙන සමාගම් මෙරට නැති බැවින්ද ගිනි නිවීමට ගිය වියදම් හැර කිසිදු මුදලක් ලබාගත නොහැකි වීමේ අවදානමක්ද මේ වනවිට මතුව ඇත. ඒ කුමක් වුවද මේ වන විටත් සාගර දූෂණයෙන් ලොව 5 වන තැන සිටින අපට අංක 1 වීම තුළින් හොඳටම කළ තරම වැඩිකල් නොගොස් පෙන්වීමට හැකිවනු ඇත.

The Gadget

# චීනයත් අතහැරපු Bitcoin



බිට්කොයින්, අපි හැමෝම දන්න අන්තර්ජාලයේ සැරිසරන මුදල් ඒකකයක්. ආසන්න වශයෙන් පහුගිය කාලය තුළ බිට්කොයින් එකක අගය ඩොලර් 65000 ආසන්න වුණත් මේ වන විට එය දැවැන්ත කඩාවැටීමකට ලක්වෙලා තියෙනවා. මෙයට ප්‍රධාන හේතුවක් වන්නේ චීනය මේ වනවිට අන්තර්ජාල මුදල් ඒකකයන් එරට තුළ තහනම් කිරීම හේතුවෙන්. මේ සමඟම සැල්වදෝරෙ ජනාධිපති ප්‍රකාශයක් කරල තිබෙනවා බිට්කොයින් තමන්ගේ රටේ නිල වශයෙන් පිලිගන්න මුදල් ඒකකයක් බවට පත්කරන්න අවශ්‍ය දේවල් මේ වනවිට පාර්ලිමේන්තුවට ඉදිරිපත් කර ඇතිබවට. මෙමගින් ලෝකයේ බිට්කොයින් පිළිගන්න පළවෙනි රට බවට සැල්වදෝරය පත්වීමට නියමිතයි.

# Nearalink - මොළයට චිප් එකක් හයි කරමුද?

ලොව දෙවනියට පොහොසත්ම මිනිසා වන එලන් මස්ක් විද්‍යාත්මක පර්යේෂණ වෙනුවෙන් ඩොලර් සිය දහස් ගණනින් වියදම් කරන පුද්ගලයෙකි. 2017දී ඔහු Nearalink සමාගම පිහිටුවන්නේ පරිගණක චිපයක් සමඟ සජීවී මිනිස් මොළයක් සම්බන්ධ කර එකවර ක්‍රියාකරවීමට පර්යේෂණ කිරීම සඳහාය. ඔබ හිතනවද මයික්‍රොමීටර් 10කට වඩා වර්ගඵලයක් තියෙන චිපයකට මිනිස් මොලයේ ස්නායු සමඟ එක්ව ක්‍රියා කරන්න පුලුවන් වේවි කියා?. හැබැයි මොවුන්ගේ පර්යේෂණවල අරමුණ වන්නේ එයයි. මෙහි ප්‍රතිඵලයක් විදිහට ඔවුන් නිමවන ලද චිපයක් වඳුරකුගේ මොළයට පර්යේෂණ සඳහා සවි කළ අතර, පසුව වඳුරා මිනිසෙකු මෙන් පරිගණක ක්‍රීඩාවන්ගේ නිරතවන විඩියෝවක් අන්තර්ජාලයට මුදාහැර තිබෙනවා. එම වීඩියෝව මෙහි ලබාදී ඇත. QR code එක මඟින් නරඹන්න. වසර 15 අංශබාගයෙන් පෙලෙන කැතිනම් ඇමරිකානු ජාතික කාන්තවකටද සාර්ථකව මෙම චිපය සවිකළ බව වර්තා වෙනවා.



# මවුස් එකෙත් කාලේ හරි වගේ

## Myo Gesture Control Armband

ඔබේ මාංශ පේශිවල ක්‍රියාකාරීත්වය හා ඔබේ අතෙහි චලනය මත පදනම්ව මෙම රැහැන් රහිත Myo Gesture Control Armband උපකරණය ක්‍රියාකරයි. මෙමඟින් මැක්, වින්ඩෝස්, iO සහ ඇන්ඩ්‍රොයිඩ් උපාංග සමඟ සම්බන්ධව සරල යෙදුම් මගින් ඉතා ඉක්මණින් කාර්යයන් කිරීමේ පහසුව ඔබට ලබාදෙයි. මෙය music, games, presentations සඳහා නැතිවම බැරි තාක්ෂණයක් බවට ඉදිරියේදී පත්වේවී.



# Aruba Instant On හොර කරලා ඉවරයි!

ගෙදර හරි ඔෆිස් එකේ හරි වයි-ෆයි නෙට්වර්ක් එකක් තියෙනවද? එහෙනම් ඔයලාට තියෙන පොදු ප්‍රශ්නෙ තමා මේ තරම් ඩේටා ප්‍රමාණයක් මාසෙ අන්තිමට ඉවර වුණේ කොහොමද කියලා. අන්න ඒකට උත්තරයක් විදිහට තමයි Aruba Instant On ගැන ඔයාලට කියන්න යන්නේ.




මෙම උපාංගය ඔයාගේ නෙට්වර්ක් එකට සම්බන්ධ කළාට පස්සේ නෙට්වර්ක් එකට සම්බන්ධ වන හැම ඩිවයිස් එකක්ම, එයලා ගියපු වෙබ්සයිට් හා ඒ සඳහා වැයවුණ ඩේටා ප්‍රමාණයත් එක්කම ඔයාට බලාගන්න පුලුවන්. ඊට අමතරව ඔයගේ නෙට්වර්ක් එකේ ස්පීඩ් එක වෙනස් කරන්න, අනවශ්‍ය ඩිවයිස් බ්ලොක් කරන්න, ටයිම් ටේබල් එකකට නෙට්වර්ක් එක ඔන්-ඕෆ් වෙන්න සහ තවත් ගොඩක් පහසුකම් මේ සමඟ ලබා දීලා තිබෙනවා.

# Nevon AIR Mask පරිස්සම් වෙමු!

බැටරි බලයෙන් යුත් පූර්ණ මුහුණු ආවරණයක් ගැනයි මේ කතා කරන්න යන්නේ. මෙම මුහුණු ආවරණය කොවිඩ් සඳහා පමණක් විසඳුමක් නොව, වායු දූෂණයටද විසඳුමක් බව මෙම මුහුණු ආවරණය නිර්මාණය කළ ඉන්දියාවේ තාක්‍ෂණික සමාගම ප්‍රකාශ කරයි. මෙහි තවත් විශේෂිත කරුණු නම් FFP2 ශ්‍රේණියේ වාතය බැක්ටීරියා සහ වෛරස්වලින් ආරක්‍ෂා කිරීම, හුස්ම ගැනීමේ සහාය සඳහා වන වායු බූස්ටරයක් තිබීම, ක්‍රියාකාරී කාබන්, රසායනික දූෂක හෝ වායූන් අවශෝෂණය කරගැනීමේ හැකියාවක් තිබීමයි.




# රැඩිකල් වෙමු!

එකෝමත් එක රටක වටු කුරුළු රංචුවක් හිටියා. දවසක් වැද්දෙක් ඔවුන්ට දැලක් එලුවා. කලබල වුණු වටුවෝ කෑගහන්න පටන් ගත්තා. වටු නායකයා කලබල නොවී, එකාමෙන් දැල ඔසවා පියාඹමුයි තම රැලට යෝජනා කළා. ඊට එකඟ වුණු වටු රංචුව දැල රැගෙන පියඹා ජීවිත බේරගත්තා. පසුදිනෙක නැවත වතාවක් මෙම වටු කුරුළු රංචුව වැද්දාගේ දැලට පැටළුණා. ඒ වෙද්දි වටු කුරුල්ලන් යම් හේතුවකට භේද බින්න වෙලයි හිටියේ. එදා එක් එක් අය තමාට අවැසි පැතිවලට දැල ඔසවන්න ගත්තා, සමහරු දැල නොඋස්සා බලා සිටියා. එදා ඔවුන් සියල්ලටම වැද්දාට බිලිවෙන්න සිද්ධ වුණා.

වර්තමානයේ අප නිර්ධන පංතිය ලෙස ධනවාදය නැමැති දැලට හසු වී පීඩාවට ලක්ව සිටින්නෙමු. දැල එලූ ධනපති පංතිය ඔවුන්ගේ හොද්ද සරි කරගැනීම වෙනුවෙන් අප අතර විරසක ඇතිකරලීමට මාන බලමින් සිටිති. කුල-මල, ජාති, ආගම් භේද ඇතිකරලමින් ඔවුන් එලූ දැලට ප්‍රතිවිරුද්ධව පියඹායාමට අපගේ එක්වීමද අහුරමින් සිටිති. උවදුරට සැබෑ හේතුව මනසින් නොබලා අපිද එකිනෙකාට ඇඟිලි දිගුකරමින් ඒ ධනවාදයේ වැද්දන්ට බිලිවෙමින් සිටින්නෙමු.

එසේ නම් නිවැරදි නායකත්වයක් ඔස්සේ නිවැරදි දිශානතියට, සුදුසු බලයක් යොදමින් දැල ඔසවා පියෑඹිය යුතුමය. තනි තනිව එකිනෙකාගේ පියාපත් ශක්තිමත් කරගැනීමට වඩා සංවිධානය වීම, සමගි වීම වටී. ඒ නිර්ධන පංතියට සංවිධානය වීම හැර අන් අවියක් නොමැති නිසාවෙනි.



# 83 කළු කළු ජූලි 23



කළු ජූලිය, ලංකාවේ බොහෝ අයට හුරුපුරුදු වචනයකි. හැම වසරකම ජූලි මාසය වනවිට මේ පිළිබඳව කතාබහ වැඩිවේ. ඒ සියලු කියවීම් අතරේ කළු ජූලිය පිළිබඳව නිවැරදිම කියවීමක් අවශ්‍ය වන්නේ එබැවිනි.

## කළු ජූලිය නිර්මාණය කළ ආසන්නතම සිදුවීම

1983 ජූලි 23 වන දින රාත්‍රී 11.30ට පමණ කැරලිකාර විමුක්ති කොටි සංවිධානය යාපනයේ තිරුනෙල්වේලිහි හමුදා මුර සංචාරයේ යෙදී සිටි ජීප් රථයට බෝම්බ ප්‍රහාරයක් එල්ල කළහ. ජීප් රථය පිටුපස ගමන් කළ ට්‍රක් රථයටද සැඟව සිටි එල්ටීටීඊ සාමාජිකයන් ප්‍රහාර එල්ල කළහ. මෙම ගැටුමේදී එක් හමුදා නිලධාරියෙකු සහ සොල්දාදුවන් 13 දෙනෙකු මියගියහ. තවත් තිදෙනකු පසුව මියගියහ. කැරලිකරුවන් ගණනාවක්ද ඝාතනය විය.

ජූලි 24 වන දින සවස 5ට හමුදා සොල්දාදුවන් දහතුන්දෙනාගේ දේහයන් පවුල්වලට බාර නොදී අවසන් කටයුතු බොරැල්ල කනත්තේ සිදුකිරීමට සූදානම් විය. නමුත් සවස 5 පමණ වන විට සිරුරු කොළඹට පැමිණ තිබුණේ නැත. මෙම ප්‍රමාදය හිතා මතා සැලසුම් සහගතව කරන ලද්දක් බව පැහැදිලිය. මේ හේතුවෙන් කොළඹ පොදු සුසාන භූමියට දේශපාලඥයන්ගේ අනුදැනුම මත රැස්ව සිටි 3,000කට අධික දේශපාලන අනුගාමිකයන් විසින් දමිළ ජනතාවට එරෙහිව ප්‍රචණ්ඩත්වය ආරම්භ කරන ලදී. මෙතනින් ඇරඹි දමිළ ජනතාවට එරෙහි ප්‍රචණ්ඩත්වය සියලු පළාත්වල විහිදී යන්නට විය. සෑම ක්‍රියාවක්ම මෙහෙයවනු ලැබුවේ ආණ්ඩුවේ දේශපාලනඥයන්ගේ මැදිහත්වීමෙනි.

1983 ජූලි 24 වන දින රාත්‍රියේ දෙමළ විරෝධී කෝලාහල කොළඹින් ආරම්භ වී රටේ වෙනත් ප්‍රදේශවලටද ව්‍යාප්ත විය. දින හතකට වැඩි කාලයක් තිස්සේ ප්‍රධාන වශයෙන් දේශපාලන මැර කණ්ඩායම් දෙමළ සිවිල් ජනයාට පහර දී, දේපල කොල්ලකා, ඝාතනයද කළහ.

මෙම ජාතිවාදී කෝලාහලයෙන් සාමාන්‍ය සිවිල් වැසියන් 400- 3,000ත් අතර ප්‍රමාණයක් ඝාතනය විය. නිවාස 8,000ක් සහ වෙළඳසැල් 5,000ක් පමණ විනාශ විය. 150,000ක ජනතාවකට නිවාස අහිමි විය. ජාතිවාදී කෝලාහලය නිසා රටට අහිමි වූ දේපලවල ප්‍රමාණය ඩොලර් මිලියන 300 ඉක්මවයි. දෙමළ ජනයා වෙනත් රටවලට පලා ගිය අතර දෙමළ තරුණයින් විශාල පිරිසක් සටන්කාමී කණ්ඩායම්වලට සම්බන්ධ වූහ.

කෝලාහලයේ වඩාත් කුප්‍රකට සිදුවීමක් ජූලි 25 වෙනිදා වැලිකඩ බන්ධනාගාරයේදී සිදුවිය. ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත යටතේ රඳවාගෙන සිටි දෙමළ සිරකරුවන් තිස්හත්දෙනෙකු සිංහල සිරකරුවන් විසින් ඝාතනය කෙරිණි. දිවි ගලවා ගත් අය කියා සිටියේ බන්ධනාගාර නිලධාරීන් ඔවුන්ගේ සිර කුටිවල යතුරු සිංහල සිරකරුවන් අතට පත්වීමට ඉඩ දුන් බවයි.

## ජාතික ගැටළුව ධනවාදී පාලකයන්ට විසඳිය නොහැක...

1983 ජූලි 11 දින ඩේලි ටෙලිග්‍රාෆ් සමඟ සම්මුඛ සාකච්ඡාවකට එක්වෙමින් J.R ජයවර්ධන දෙමළ ජනයාට එරෙහි ප්‍රචණ්ඩත්වයට රජයේ අනුග්‍රහය ප්‍රකාශ කළේය.

"යාපනයේ (දෙමළ) ජනතාවගේ මතය ගැන මම දැන් කණගාටු නොවෙමි. දැන් අපට ඔවුන් ගැන සිතිය නොහැකිය. ඔවුන්ගේ ජීවිත ගැන හෝ අප ගැන ඔවුන්ගේ මතය ගැන නොවේ. ඔබ උතුරට වැඩි වැඩියෙන් පීඩනය යෙදෙන තරමට සිංහල ජනතාව මෙහි සිටිනු ඇත...ඇත්ත වශයෙන්ම දෙමළ ජනයා කුසගින්නේ සිටියහොත් සිංහල ජනතාව සතුටු වනු ඇත...."

83 කළු ජූලිය හුදු ජනතාව විසින් ක්‍රියාවට නගන ලද්දක් නොවේ. ඒ වන විටත් රට තුළ ගොඩනැගෙමින් තිබූ දැවැන්ත ආර්ථික අර්බුදයට UNP ආණ්ඩුවට මුහුණදීමට නොහැකිව තිබිණි. විවෘත ආර්ථිකය හඳුන්වා දුන් ජයවර්ධන පාලනයේ අසාර්ථකත්වය සමාජගත වෙමින් තිබිණි. ධනවාදී පාලනයේ අසාර්ථකත්වය වසාගැනීමට 1983 ජූලි 23 වෙනිදා සොල්දාදුවන්ගේ ඝාතනය යොදාගනිමින් ආණ්ඩු විරෝධය දෙමළ ජනතාව වෙත හැරවීය. එය සිංහල-දෙමළ ගැටුමක් බවට පත් කළේය. නිර්ධන පංතිය ජාතිකත්ව අනුව ඇණකොටා ගන්නා තැනට පත් කළේය. එය ධනවාදී පාලකයන්ගේ නරුමකමයි. ම්ලේච්ඡත්වයයි. ආණ්ඩුවේ අසාර්ථකත්වය වසාගැනීමට මිනිස් ජීවිත බිලිදුන්හ. අනවබෝධිත ජනතාව පාලකයාට එරෙහිව සටන් කරනවා වෙනුවට සහෝදර ජනතාවට එරෙහිව අවි එසවීය.

## ජාතිවාදය දැන් අවසන් ද?

තිස් අවුරුදු යුද්ධය නිමාවීමෙන් පසු ජාතිවාදී කෝලාහලය අවසන් යයි සමාජ මතයක් ගොඩනැගෙමින් තිබේ. තර්කානුකූලව ප්‍රශ්නය කියවා ගනු ලැබුවහොත් ජාතිවාදී ගැටුමේ බෙදුම්වාදී පෙරමුණ යුධමය වශයෙන් පරාද වී තිබුණත් එහි ජාතිවාදී ස්වරූපය තවම පෝෂණය වෙමින් තිබේ. මන්දයත් එය ධනපති පාලකයන්ගේ පැවැත්මේ ජීවනාලියක් වී පවතින බැවිනි.

පාලකයා අසාර්ථක වන ඕනෑම තැනකදී ජාතිවාදී ගැටුම් රට තුළ නිර්මාණය කරනු ලබයි. ජේ. ආර්. පාලනය අසාර්ථක වන විට දෙමළ ජනතාවට එරෙහිව සිංහල ජනතාවවත්, රාජපක්ෂ පාලනය අසාර්ථක වන විට මුස්ලිම් ජනතාවට එරෙහිව සිංහල ජනතාවවත් මෙහෙයවයි. පසුගිය කාලය පුරාවටම ඊට අදාළ සිදුවීම් රාශියක් සමාජගත විය. කළු ජූලිය අවසන් නැත. ඉන් පාඩම් ඉගෙනගෙ නද නැත. නමුත් කළු ජූලියක් ඇතිවීම වැළැක්වීමේ වගකීම ඇත්තේ මහජනයා වන අපටය.

## ජාතිවාදී ගැටුම් කිසිදා විසඳිය නොහැකි ද?

ජාතිවාදය ධනවාදය විසින් විසඳා අවසන් කළ යුතුය. නමුත් ධනවාදය මුහුණ දී තිබෙන දැවැන්ත සමාජ ආර්ථික අර්බුදය ජාතිවාදය විසඳනවා වෙනුවට තම පාලන බලය තහවුරු කරගැනීමේ මෙවලමක් ලෙස භාවිතා කරයි.

එනිසා ජාතිවාදී ගැටුම් විසඳිය හැකිකේ සමාජවාදී පාලන ක්‍රමයක් තුළ පමණි. ලෝකයේ සමාජවාදී රාජ්‍යයන් මෙම ජාතික ගැටළුවට සාර්ථක ලෙස විසඳුම් ලබා දී තිබේ. ලංකාවේද ජාතික ගැටළුව විසඳිය හැක්කේ සමාජවාදී පාලන ක්‍රමයක් තුළ පමණි. සෑම පුරවැසියකුටම සමාන අයිතිවාසිකම් හිමිවෙන, සෑම පුරවැසියකුටම සමාන අවස්ථාවන් හිමිවන, ලාභය වෙනුවට මිනිස් අවශ්‍යතා මූලික කරගත් පාලන ක්‍රමයක් තුළ ජාතික ගැටලුව නැතිනම් ජාතිවාදී ගැටලුව වියැකී යනු ඇත. තවත් කළු ජූලියන් නිර්මාණය නොවනු ඇත.

# කවි නිම්නය

**ඔබගේ නිර්මාණ සඳහා ඉඩක්**
ඔබගේ කවි නිර්මාණ අප වෙත එවන්න.
අප සුදානම් ඔබගේ නිර්මාණ සඳහා ඉඩක්
FORWARD කවි පිටුවේ වෙන් කරන්න.
මෙන්න අපගේ ලිපිනය
FORWARD කවි පිටුව,
අංක464/20, පන්නිපිටිය පාර,
පැලවත්ත, බත්තරමුල්ල.
syuforwardnews@gmail.com

## පුල්ලෙයාරෙට වැඳපු අත්දෙක

ඉඳගෙන හිටියෙ බිම
ගහගෙන ටෝච් එක
පුල්ලෙයාරෙට පුදපු තැන..
ගහට පිට දීගෙන
ඇස් ලොකුකරගෙන
හැරෙනකොට
අංසක හතලිස්පහක්,
ගැහුවෙ ඌ නළලට
අඹරා කකුල හරහට..
කරකවා ,
දෙයියන් වැඳපු අත්දෙක...
අලියා හිටියෙ ගහ මුල
පුල්ලෙයාරෙත් නෑ දැක්කේ
කිරි උතුරපු තැන කන්දේ..

] **බුද්ධික සම්පත් - අනුරාධපුර** [



## වස්සානයට ඇවිත් යන්න

ඉඩෝරයක අවසානයේ
වසන්තය ද තිබුණා.......

කර්කෂක තැන්වලත්
පතොක් මල්වල එල දැරුවා.......

වසන්තය නුරාවිත්
ඉඩෝරය ද නිවුණා.........

ඉඩෝරයට නොපිපි මල්
වසන්තයේදී පිපුණා.........

]**නෙරාජ් තෂ්මන්ත - හම්බන්තොට**[

## චීනට උකස්, ආශ්චර්ය

ඔන්න හම්බන්තොටත් හදලා, චීන සිරිතට බංගලා....
අපේ කෙල්ලන් දෙමුද උන්හට, එහෙන් ගෙන්නමු නංගිලා...
මමත් හිතුනොත් මගුල ගන්නව, චීන හෝටලේ ශැංග්‍රිලා....
හූනො බලුමස් ඩෙවල් දෙන්නම්, කුකුල් අඬු යට හංගලා...

කිරල කැලය ම ගොඩකරමු අපි, උන්ගෙ බුල්ඩෝසර වලින්.....
කලමැටිය රක්ෂිතය පුරවමු, චීන ටියුලිප් මල් වලින්....
වෙරළ තීරය පිනට දන් දෙමු, වැඩක් නෑ බං වැලි වලින්...
බුන්දල ඇත් පැටව් මරලා, මාල පලඳමු දළ වලින්....

සිහල බොදුනු පන්සල්වල ගූ හුලිජ්ජ තවරද්දෙන්....
ඉස්ලාම්, කිතුනු පුදබිම්වල ජාති ගින්න අවුලද්දෙන්....
දමිළ හින්දු කෝවිල්වල තිරුක්කුරල් පාගද්දෙන්...
අනේ මගේ ලක් අම්මා චීන්නුන් ම කෙළෙසද්දෙන්....

] **පසිඳු විජේනායක** [

## චෞර පබ්බතය මුදුනතින් හෙලට

අර ඈතින් පෙනෙන්නේ
චෞර පබ්බතය
බොහෝ මිනිසුන් හෙලන්නේ
එතනින් පහලටය

කුසගින්නට සොරකම් කළ අය
පමණක් නොව නිතරම
දරුපැටවුන් එගොඩහ යැවුමට
වරදට එරෙහිව හඬ ගෑ සොයුරොයි
එතනට දක්කන්නේ සබඳ

ඒ ඒ කාලවල ඒ යන මාවත
වල් වැදී තිබුණා බොහෝ උස මහතට
දැන් ඒ මාවත එළි පෙහෙළිය හොඳට
නිලමැස්සෝ බෙර ගහගෙන
අර යන්නේ ඒ පාරෙය

] **ධනංජය බණ්ඩාර - නුවරඑළිය** [

## වීනස්ගෙ මහපොළොව

ඇරඹුමේදී
ඈ උන්නෙ ඈතින්
මට ළංවෙන්න තියා
හිතන්නටවත් බැරි තරම් ඈතින්
නිල් පාට ඇස් බෝල
හීනි කරගෙන
මායිම් නැති මහ පොළොව
ගිලින්න වගේ බලාගෙන..

අහන්නට හිතුණත් නිතරෝම
"මක්කෙයි හොයන්නේ"
ඈ රවයි බැන වදියි
මගේ හිත බිය වුණෝත්
බලං උන්නා නිහඬවම
ඈ දිහා හොරාට..

ඇත් දළ පාට දෙවඟනක්
උන්නා ඇගේ පොතක ඇඳ
"වීනස් තමා මේ"
ආදරේ දෙවඟන..

හිනා වෙද්දි ඈ තනියම
හරි හැඩයි ඇගේ වුවනත
කියන්නට හිතුනත්
"වීනස් වගෙයි උඹ"
වේලිච්ච උගුර යට
හැංගුවා ඒ වචන ටික..

දැන් ඈ මං ළඟින් හිඳ
නිල් පාට ඇස් වලින්
මගේ කැත මූණ ඉඹ
මුමුණනව යන්තමට..

"උඹෙ ඇසුත් උඹ වගෙයි
කළු පාට විතරමයි
වීත් ඒ ඇස් බෝල මත
ප්‍රතිබිම්භ වෙලා මහ පොළොව
මායිම් වලින් බෙදී නැති
සෙනෙහෙබර මහ පොළොව.."

] **සඳුනි නුවන්තිකා - කොළඹ** [

## තොපිත් පලයව්!

වෙරළෙ වැලි කැට සුදු උනත්
අද කලු වෙලා මොකදෝ උනේ?...
වෙනද අඬනා රැලිවලත්
කිසි සද්ද බද්දක් නෑ අනේ!

මීගමුවෙ කලපුවෙන් ගොඩ ගැසු
නැවක සුන්බුන් කුණු දිගේ...
අප්ප නැති අම්මෙකුත් බැහැගෙන
යස ඉසුරු හොයනව පෙනේ...

අරෙහෙ බලපං, මෝඩ එකියක්
හොයනවා කුණු පෝලිමේ...
පිස්සු ගෑණියෙ මෙහෙ වරෙං තෝ
මැරෙන්නද ඔය හදන්නේ...

මෙහේ බලපං, තොපිට පිස්සුද
මොකද අනෙ තොපි නොයන්නේ...
සෝක් කෑමක් හම්බුනා මට
ලොක්ඩවුන් එක වෙලාවේ...

තොපිත් පලයව්! තව තියෙනවා
අන්න අර වෙරළේ කොනේ...
මේකවත් නැති උනොත් කොහොමද
ලේ උනත් කිරි කරන්නේ?...

] **දිලීප ලක්ෂාන් - හම්බන්තොට** [

## පෝට් සිටියේ සිට..

රට ලොකු කළා මහ මුහුදත් ගොඩ කරලා
එය චීනාට දුන්නා ඔබ ගැන හිතලා
දේශප්‍රේමයෙන් ඔද තෙද බැම් බැඳලා
දැන් බය හැකක් නැත, ඇත මව්බිම රැකිලා

ආවොත් තියන්නට අත මව්බිමට අපේ
මහ සඟරුවන ඇත සටනට දිදී ඔපේ
වඳ කොත්තුවක්, වඳ බෙහෙතතුත් ගසා හපේ
සුන් කරලන්න ගමු අසිපත් තබා ලිපේ

රාවණ, බොදුබලය, සිංහලයේ රාවේ
මෙකී නොකී බුදුපුත් පෙරමුණු ආවේ
රට විකුණද්දී මේ හැම නිහඬව පෑවේ
මොන කීකරුකමද කාටද බිලි වුවේ..?

] **ගාමිණී දිසානායක - අනුරාධපුර** [



# Covid වසංගතය හා ධනවාදයේ අර්බුදය



Covid-19 වසංගතය වැලැක්විය හැකි ව්‍යසනයක් වන අතර එයට ලෝකය වඩා ඉක්මණින් ප්‍රතිචාර දැක්වූයේ නම් මිලියන ගණනකගේ ජීවිත අහිමිවීම වළක්වා ගත හැකිව තිබූ බව ලෝක සෞඛ්‍ය සංවිධානය මෑතකදී ඉදිරිපත් කළ වාර්තාවේ සඳහන් වෙයි.

මෙම කමිටුව මේ සඳහා ගෝලීය නායකත්වයට සෘජුව දෝෂාරෝපණය කරයි. ඔවුන්ට අනුව 2020 පෙබරවාරි මාසයේදී වසංගතය වළක්වා ගැනීමට අවස්ථාව තිබූ මුත් එම අවස්ථාව ලෝකය විසින් අහිමි කර ගත් මාසයක් ලෙස සැලකේ. මෙහිදී බොහෝ රටවල් තම ආර්ථික අරමුණු උදෙසා කල් බැලීම, අවශ්‍ය ක්‍රියාමාර්ග නොගැනීම හේතුවෙන් අද වන විට මිලියන ගණනක් තම ජීවිතවලින් වන්දි ගෙවමින් සිටියි.

විසිඑක්වන සියවසේ මිනිසුන් අඟහරු ගවේෂණ සඳහා යානා ගොඩබෑසීමේ අනවරත තරඟයක සිටින ලෝකයක් තුළ, ඉතාමත් දියුණු සෞඛ්‍ය උපකරණ නිර්මාණය වෙමින් පවතින යුගයක, 1918දී spanish flue වසංගතයේදී ලෝකයට අහිමි වූ ජීවිත ප්‍රමාණයට සාපේක්ෂව ජීවිත ප්‍රමාණයක් අද වන විටද අහිමිවෙමින් පැවතීම කිනම් අභාග්‍යයක්ද? මෙයින් පැහැදිලි වන්නේ ධනවාදයේ අසාර්ථකභාවය නොවේද?

කොරෝනා වසංගතය ආරම්භවීමත් සමඟ සියලුදෙනා මෙහි වින්දිතයන් වුවද අද වන විට ධනවත් පුද්ගලයන්ට ජීවත්වීමේ අයිතිය ලබාදෙමින්, දුප්පත් දුබල මිනිසුන්ගේ ජීවත්වීමේ අයිතිය උදුරාගනිමින් ඇත. අප අසල්වැසි ඉන්දියාව දෙස බැලීමේදී, ඉන්දියාව යනු ලොව එන්නත් නිපදවීමේ ධාරිතාවය වැඩිම රටවල්වලින් එකකි. එමෙන්ම ලෝකයට ඔක්සිජන් නිපදවන රටවල්වලින් එකකි. එපමණක්ද නොව, ඉතාමත් දියුණු සෞඛ්‍ය පහසුකම් සහිත දැවැන්ත ආරෝග්‍යශාලා පද්ධතියක් හිමි රටකි. නමුත් අද වන විට තම රටේ පුරවැසියන්ගේ ජීවිත බේරාග ැනීමට නොහැකි තත්වයකට ඉන්දියාව පත් වී ඇත.

ලෝකයේ ධනවත් රටවල් සියල්ලෙහිම පාහේ මේ වනවිට වසංගත තත්වය හේතුවෙන් ලක්ෂ ගණනක් ජීවිත අහිමි වෙමින් පවතී. ධනවාදය විසින් දැනුවත්ව කළ සමූල මිනිස් ඝාතනයක ලෙස මෙය හැඳින්වීම වරදක් නොවේ. නමුත් මෙලෙස ඉතා දියුණු සෞඛ්‍ය පහසුකම්, තාක්ෂණය, ආර්ථික බලය ඇති ධනවත් රටවල් තම පුරවැසියන්ගේ ආරක්ෂාව සැලසීමට අපොහොසත් වුවද, මෙම වසංගතය හමුවේ සාර්ථකව මුහුණ දෙන රටවල්ද කීපයක් වේ.

එවන් රටවල් විස්සක් දූපත් රාජ්‍යයන් වන අතර දෙකක් දූපත් නොවන රාජ්‍යයන් වේ. මේ අතර වියට්නාමය, තායිවානය, කියුබාව, භූතානය, නවසීලන්තය වැනි රටවල් හමුවේ. ඔවුන් තම පුරවැසියන්ගේ ජීවිතය ආර්ථිකය උදෙසා නොව, ආර්ථිකය තම පුරවැසියන් උදෙසා යොදාගත් රටවල් වේ. ධනවත් රටවල් තම ආර්ථිකයට මුල්තැන දෙමින් මෙම වසංගත තත්වය තුළ වුවද බහුජාතික සමාගම් හා එක්ව ලාභ ඉපයීමේ ඉල්ලමක් බවට මෙම වසංගතය පත් කරගෙන ඇත. නොයෙක් නම්වලින් ආවද ධනවාදයේ අර්බුදයෙන් ගොඩ ඒමට මුළු මහත් සමාජයට හැකියාවක් නැත.

ධනවත් රටවල් සෑම තත්පරේකට එක් පුද්ගලයකු සඳහා එන්නත් ලබාදෙන අතර දුප්පත් රටවල්වලට අද තමන්ගේ ජනගහනයෙන් සීයට එකකට අඩු ප්‍රමාණයකටවත් එන්නත් ලබාදීමට නොහැකි වී ඇත. Covid-19 එන්නත් මාත්‍රා බිලියන දෙකක් ආසන්නව ලබා දී ඇතත්, එම මාත්‍රාවන්ගෙන් සියයට 75ක්ම බෙදී ගොස් ඇත්තේ රටවල් දහයක් අතරය. මෙයිනුත් සියයට හැටක් බිදී ගොස් ඇත්තේ චීනය, එක්සත් ජනපදය සහ ඉන්දියාව අතරය.

මේ සියල්ලෙන්ම පැහැදිලි වන්නේ මේ වනවිට ලෝකය මේ ධනවාදයේ අසාර්ථකභාවය හා නරුමකමින් බැටකන බවයි. වරෙක එංගල්ස් පැවසූයේ මානව සමාජය සමාජවාදය දක්වා ඉදිරියට නැතහොත් ම්ලේච්ඡත්වය කරා පසුපසට යා යුතු බවයි.

සමාජවාදය මුල්කොට ගත් මානව ප්‍රේමය, සමාජ සාධාරණත්වය, මුළු මහත් ලෝකයටම ආදරය කරන, ගහකොළ සතා සිවුපාවනට මෙන්ම මේ මහපොළොවට, අහසට ආදරය කරන සමාජයක් නිර්මාණය කිරීම වෙනුවෙන් වෙහෙසෙන වියට්නාමය වැනි සමාජවාදී රටවල්වලට තම පුරවැසියන්ගේ ජීවිත මෙම වසංගත තත්වය මුදාගැනීමට හැකියාව ලැබී ඇති අතර ඔවුන් තම ආර්ථිකයද නංවා ගෙන ඇත.

එමෙන්ම දැඩි ඇමෙරිකානු සම්බාධක හමුවේ වුවද සමාජවාදී කියුබාව Covid-19 සඳහා වැඩිම එන්නත් සංඛ්‍යාවක් නිපදවන රට බවට පත් වී ඇත. ඔවුන් මේ වන විට එන්නත් වර්ග පහක් නිපදවා ඇති අතර මෙම වසර අවසාන වන විට තම රටේ සියලුම පුරවැසියන් එන්නත් කිරීමට බලාපොරොත්තු වේ. එමෙන්ම වසංගත තත්වය ඉතාමත් දරුණුම අවස්ථාවේදී පවා ඉතාලිය, චීනය වැනි රටවලට තම සෞඛ්‍ය බලකායයන් පිටත් කොට තම සමාජීය සේවය ඉටුකිරීමට කැපවෙන ලදී.

මේ සියල්ල අභිමුව කොරෝනා වසංගතය අපට කියාදෙන පාඩම වන්නේ සියලුදෙනා රැකෙන තුරු කිසිවෙකු ආරක්ෂිත නොවන බවයි. එසේ නම් මුළු මහත් ලෝකයම එකට එක් වී, යා යුතු නව සමාජ ආර්ථික වෙනසකට මග සෙවිය යුතුය. ඒ සඳහා මානව ප්‍රේමයෙන් පිරිපුන් සියලු මිනිසුන්ගේ නැගීසිටිය යුතු කාලය එළඹ ඇත.

## ඊජිප්තුවේ මමියක CT ස්කෑන් පරීක්ෂණයක් කරයි




ඊජිප්තුවේ විසූ Ankhekhonsu නම් පූජකයෙකුගේ බවට සැක කෙරෙන මමියක CT ස්කෑන් පරීක්ෂණයක් කර බැලීමට ඉතාලියේ මිලානෝ නුවර පොලික්ලිනිකෝ රෝහල පසුගියදා කටයුතු යොදා ඇත. මීට වසර 3000කට පමණ පැරණි මෙම මමිය ඊජිප්තු සොහොන් ගැබක තැන්පත් කරන්නට ඇතැ-යි විශ්වාස කෙරේ. මෙවැනි මමී තුළ ඇති රහස් සොයාබැලීමේ අරමුණින් මෙලෙස මෙය CT ස්කෑනරයක් තුළට යවා ඇත. මේ සම්බන්ධයෙන් අදහස් දක්වන පර්යේෂක ව්‍යාපෘතියේ අධ්‍යක්ෂ සබීනා මල්ගෝරා පවසන්නේ-න් මමී යනු ජෛව විද්‍යාත්මක කෞතුකාගාර බවත් ඔවුන් කාල කැප්සූලයක් වැනිය යනුවෙනි.

## වැටුප් වැඩි කරන ලෙස ඉල්ලා නවසීලන්ත හෙදියෝ වර්ජනයක



පසුගියදා නවසීලන්ත හෙදියන් 30,000ක පමණ පිරිසක් සිය රැකියාවලින් බැහැරව පැය 8ක පමණ වැඩවර්ජනයක නිරත වූ බව වාර්තා වේ. සිය වැටුප් ඉහල දැමීම සහ රැකියා තත්වයේ ගුණාත්මක බව වැඩිකිරීම සම්බන්ධයෙන් රජය සමඟ පැවති සාකච්ඡා අසාර්ථක වීම මෙම වර්ජනයට හේතු වී ඇත. විශේෂයෙන්ම හෙද සේවාව වෙනුවෙන් 1.4%ක වැටුප් වර්ධකයක් ලබාදීමට සෞඛ්‍ය මණ්ඩලය ලබා දුන් යෝජනාවට මෙලෙස විරෝධය දක්වා ඇතැයි පැවසේ. කෙසේ වෙතත් නවසීලන්ත රජය පවසන්නේ හෙද සංගමය 17%ක වැටුප් වර්ධකයක් ඉල්ලා ඇති බවයි.

## කෝවිඩ් 19 නිසා බිහි වූ Grace රොබෝව



රෝගියෙකු වෙත සමීප වෙමින් රෝගියාට අවශ්‍ය සත්කාර සේවා ලබාදීමට නවතම මානවරූපී රොබෝවක් නිපදවන්නට හොංකොංහි හැන්සන් රොබෝටික්ස් සමාගම සමත් වී ඇත. හෙදියකගේ නිල ඇඳුමට සමාන නිල්පැහැති ඇඳුම් ඇඳි Grace රොබෝවේ පපුවේ සවි කර ඇති උෂ්ණත්වය මනින කැමරා උපකරණ මගින් රෝගියාගේ ශරීර උෂ්ණත්වය මෙන්ම රෝගියා වෙත ලබා දිය යුතු ප්‍රතිචාර පිලිබඳ නියමාකරයෙන් වටහාග ැනීමක් ලබා දෙයි. මීට අමතරව රොබෝව සතුව ඇති කෘත්‍රිම බුද්ධිය මගින් ඉංග්‍රීසි, මැන්ඩරින්, කැන්ටෝනිස් යන භාෂාවලින් රෝගියා සමඟ අදහස් හු-වමාරු කර ගැනීමටද හැකිය.

## වෙනිසියුලාවේ COVAX වැඩසටහනට ඇමරිකාවෙන් බාධා



වෙනිසියුලාවට අවශ්‍ය Covid සඳහා එන්නත් ලබාගැනීමේ COVAX වැඩසටහන වෙත ඇමරිකා එක්සත් ජනපදය බාධා කරන බවට එරට උප ජනාධිපතිනි ඩෙල්සි රොඩ්ගස් චෝදනා කරයි. එරටට හිමිවිය යුතු එක්සත් ජනපද ඩොලර් මිලියන 10ක මුදලක් වෙත සම්බාධක පනවමින්, ඒ සඳහා ගෙවිය යුතු මුදල් අවහිර කිරීමට ඇමරිකාව කටයුතු කරන බව ඇය වැඩිදුරටත් පවසා සිටී. වෙනිසියුලානු ජනතාවට මේ දක්වා ලබා දී ඇත්තේ ප්‍රතිශක්තීකරණ එන්නත් 28,000ක ප්‍රමාණයක් පමණි.



ආගම බිහිවීම-06 කොටස

**පසුගිය කලාපයෙන් අප ඔබ වෙත ගෙන එනු ලැබුවේ ක්‍රිස්තියානි ආගම බිහිවීම සහ ජේසුතුමාගේ උපතයි. අද ඔබට ගෙන එනු ලබන්නේ ක්‍රිස්තියානි ආගම බිහිවීම සඳහා ජේසුතුමාගේ ඉගැන්වීම් සහ කිතු දහමේ ව්‍යාප්තියයි.**

# ඉස්ලාම් දහම බිහිවීම සහ අරාබි අර්ධද්වීපය



පසුගිය කලාපයෙන් ඔබ වෙත ගෙන එනු ලැබුවේ කිතුදහම හා එහි ව්‍යාප්තියයි. ඒ වගේම ජේසුතුමන්ගේ ඉගැන්වීම් පිළිබඳවද ඔබ වෙත ගෙන එනු ලැබූ අතර ජේසුතුමාගේ මරණය සිදුකරනු ලැබූ රෝමවරුන්ටම කිතුදහම රැකගැනීම හා ප්‍රචාරකයා වීමට සිදුවීම දක්නට ලැබීම එහි සුවිශේෂ සිදුවීමක්ය. ඉන් නොනැවතී රෝමවරු විසින් තම අධිරාජ්‍යයේ ආගම බවට කිතුදහම පත්කළ අතර ක්‍රිස්තු වර්ෂ 313දී මිලාන් ආඥාව මගින් කිතුදහම රෝම අධිරාජ්‍යය තුළ නීත්‍යානුකූල දහම බවට පත් කළේය. රෝමවරුන් විසින් අලුත් අගනුවරක් ලෙස කොන්ස්තන්තිනෝපලය ඉදිකොට එය මරියතුමිගේ නාමය වෙනුවෙන් කැප කෙරිණි. 4 වන සියවස වනවිට රෝමයේ සිටි අධිරාජයා වූ තියඩොසියස් විසින් මිත්‍යාදෘෂ්ටික දෙවිවරුන් ඇදහීමේ පුරුද්ද අවලංගු කොට කතෝලික දහම රෝම අධිරාජ්‍යය පුරාවටම පැවතිය යුතු එකම නිත්‍යානුකූල ආගම බවට ප්‍රකාශ කළේය. එහි ප්‍රතිඵලයක් ලෙස රෝම වැසියෝ රෝම අධිරාජ්‍යයට වඩා ක්‍රිස්තු පල්ලිය කෙරෙහි ඇදී ගියහ. විදෙස් ආක්‍රමණ පැමිණි විට අධිරාජ්‍යයා බේරාගැනීමට වඩා ක්‍රිස්තු පල්ලිය බේරාගැනීමට වෙහෙසුනහ. එනයින් රෝම අධිරාජ්‍යය බිඳවැටුණද ක්‍රිස්තු පල්ලිය බලවත්ව නැගී සිටියේය. නැගෙනහිර රෝම අධිරාජ්‍යය තුළ (බ්‍රසෙන්තියම්) සිටි වහලුන් අතර කිතුදහම ශීඝ්‍රයෙන් ව්‍යාප්ත විය. නූතන යුගයේ කිතුදහම විවිධ කල්ලි සංවිධානය යටතේ ක්‍රියාත්මක වන අතර ලෝක ජනගහනයෙන් තුනෙන් එකක පමණ පිරිසක් අදටත් එහි අනුගාමිකයෝ වෙති.

## ඉස්ලාම් ආගම

ඉස්ලාම් ආගම බිහිවීම සිදුවනු ලබන්නේ මොහොමඩ් නබිතුමාගේ උපතත් සමඟය. ක්‍රිස්තු වර්ෂ 570දී නබිතුමාගේ උපත සිදුවේ. එම කාලයේ අරාබිය පුරාම විවිධ අරාබි ගෝත්‍රවලින් සැදුම්ලත් ජනාවාස සහිත සමාජයක් දක්නට ලැබුණු අතර එම ගෝත්‍ර සහ ජනාවාස අතර අඛණ්ඩව ගැටුම් පැවති අතර එම ගැටුම් නිසා අරාබියේ එක්සත්කමක් දක්නට නොවීය. මේ නිසා වෙනත් මහද්වීපවල රජවරුන්ගේ විවිධ ආක්‍රමණයන්ට නිරතුරුවම මුහුණදීමට සිදුවූ අතර අරාබියේ සංවර්ධන කටයුතු සිදුනොවූ තරම්ය. එනිසා මෙම ගෝත්‍ර අතර සාමූහිකත්වයක් ඇති කළ යුතු විය. එම අවශ්‍යතාවය සම්පූර්ණ වූයේ ඉස්ලාම් දහමින්ය. මොහොමඩ් නබිතුමා විසින් එම ඉස්ලාම් දහම දේශනා කරන ලදී.

මහම්මත්තුමාගේ අලුත් ආගමික විශ්වාසයට උණුසුම් පිළිගැනීමක් ලැබුණේ මදිනා නගරයේදීය. ශ්‍රාවකයින් විශාල වශයෙන් ඔහු වටා එක්රොක් වූ අතර මහම්මත්ගේ කීර්තිය සහ ඔහුගේ අදහස් අරාබිය පුරා පැතිරෙන්නට විය. ක්‍රිස්තු වර්ෂ 630දී ඔහු මක්කම අල්ලාගත් අතර එහි ජනතාව වෙත ඔහුගේ අදහස් බලහත්කාරයෙන් තහවුරු කරන ලදී. මෙලෙස මහම්මත්තුමා අලුත් ආගමික මූලබීජ අරාබිය පුරා වැපිරීමට සමත් විය. කල්ගතවත්ම ලෝකයේ ප්‍රධාන ආගම් අතරටද එකතු විය. ක්‍රි.ව. 632දී ඔහු මියගිය නමුත් ඒ වන විට ඔහුගේ අලුත් ආගම ව්‍යාප්ත කිරීම සඳහා දැඩි උනන්දුවකින් කටයුතු කළ ඔහුගේ අනුගාමිකයන්ගේ දක්ෂ නායකත්වය යටතේ අරාබිය ප්‍රායෝගිකව එක්සත් කොට තිබුණි.

## ඉස්ලාම් ආගමට පෙර අරාබිය

අරාබි ප්‍රදේශය ලෝකයේ ශ්‍රේෂ්ඨ ශිෂ්ඨාචාර දෙකකින් පෝෂණය ලබා ඇත. එනම් ඊජිප්තුව මූලික කොටගත් නයිල් නිම්න ශිෂ්ටාචාරය (ක්‍රි.පූ. 3400 - ක්‍රි.පූ.1100) සහ ඉරාකය පදනම් කරගත් මෙසපොතේනියානු ශිෂ්ටාචාරය (ක්‍රි.පූ. 1700 - ක්‍රි.පූ.539)ය. නයිල් නිම්න ශිෂ්ඨාචාරය සංවර්ධනය කරනු ලැබුවේ ලෝකයට පිරමීඩ දායාද කළ පාරාවෝවරු විසිනි. පාරාවරුන්ගේ වැටීමෙන් අනතුරුව ටොලමි රාජවංශය එහි බලයට පත් විය. එහි අන්තිම පාලකයා වූයේ ක්ලියෝපැට්‍රා රැජිණයි. මෙසපොතේනියානු ශිෂ්ටාචාරයෙහි (යුප්‍රටීස් හා ටයිග්‍රීස්) ප්‍රධාන පාලකයා වූයේ හමුරාබි නම් බැබිලෝනියානු අධිරාජයාය. ක්‍රි.පූ. 1792- ක්‍රි.පූ.1750 අතර කාලයේ ඔහු පාලනය කළ අතර ඔහු විසින් ලෝකයට හමුරාබි නීති මාලාව හඳුන්වා දෙන ලදී.

මේ හැර මහා පර්සියානු අධිරාජ්‍යය පිහිටියේද අරාබි භූමිය තුළය. ආර්මේනියානු කඳුකර මිනිසුන්ගෙන් ඇරඹුණු පර්සියානු අධිරාජ්‍යයේ ආරම්භකයා වූයේ මහා සයිරස් රජු (ක්‍රි.පූ.550 - ක්‍රි.පූ.529)ය. එවකට පර්සියාවේ ආගම වූයේ ශරථුස්ත්‍ර ඒකදේවවාදයයි.

අරාබිය යනු අතීතයේ සිටම යුදෙව් ජාතිකයන් වාසය කළ භූමියකි. හිබෲවරුන් හෙවත් යුදෙව් ජාතිකයන් පිළිබඳ ඉතිහාසයද ක්‍රිස්තු පූර්ව 2000ක පමණ ඈත අතීතයට ගමන් කරයි. ඔවුන්ගේ නායකයා වූ ඒබ්‍රහම් ක්‍රි.පූ. 1400දී පමණ සිය ගෝත්‍රික ජනතාව ඌර් ප්‍රදේශයේ සිට පලස්තීනය නම් ප්‍රදේශයට කැඳවාගෙන ගියේය. මෙම ප්‍රදේශ ජොහොවා නම් දෙවියන් තමන්ට දෙන ලද භූමිය ලෙස ඔහු සලකන ලදී. ක්‍රිස්තු පූර්ව 13 වන සියවසේදී එම භූමිය බිහිසුණු සාගතයකට ගොදුරු විය. එම අවස්ථාවේ ඔවුහු තම භූමිය අතහැර ඊජිප්තුවේ උතුරු ප්‍රදේශයට ගියහ. එහිදී ඔවුන් පාරාවරුන්ගේ වහලුන් බවට පත් විය. ඔවුන් එම තත්වයෙන් ගලවා ගත් මෝසස් විසින් නැවත ඔවුන්ව ඊජිප්තු පාලනයෙන් මුදාගෙන පලස්තීනය වෙත ගෙන එන ලදී. යේසුස් වහන්සේද ඉපදුනේ එම කලාපයේම පිහිටා ඇති ජෙරුසෙලම අසල බෙත්ලෙහෙම ප්‍රදේශයේදීය.

# ඊශ්‍රායලයට හමාස් සංවිධානය අතුරුදහන් කිරීමට නොහැකිය

## මන්දයත් ගැටලුව මිලිටරි එකක් නොවේ, එය දේශපාලනිකය




එක්සත් ජනපදය වසරකට ඩොලර් බිලියන ගණන් ඊශ්‍රායලයට පොම්ප කරන්නේ ඊශ්‍රායලයට පලස්තීන ඉඩම් ඈඳාගැනීමට හෝ පලස්තීන නිවාස විනාශ කිරීමට නොවේ.

එක්සත් ජනපද කොංග්‍රස් සභික හා නීති සම්පාදිකාව, Betty McCollumg අනුව එක්සත් ජනපදය ඊශ්‍රායලයට පොම්ප කරන මුදල වාර්ෂිකව ඩොලර් බිලියන 3.8කි. මේ කුමක් සඳහාද? ඊශ්‍රායල් ජාතිකයින්ට ආහාර සඳහාද? අධ්‍යාපනය හෝ නිවාස සඳහාද?

එසේ නොවන බව සිතමි. මේ ගෙවීම එක්සත් ජනපදයට ඉහලින් යාමට උත්සාහ කරන මැදපෙරදිග කලාපයේ ඕනෑම රටකට පහරදීමට අවශ්‍ය, ඊශ්‍රායලයට වැයවන සම්පත් සඳහාය. ඒ අනුව එක්සත් ජනපදයේ උවමනාවට ඊශ්‍රායලය යේමනයට, ලෙබනනයට, ඉරාකයට බෝම්බ දමයි. ඉරානයට හා සිරියාවට පහරදෙයි. එහෙත් ඔවුහු පලස්තීනයට පහරදෙන්නේ භූමිය ඈඳාගැනීමේ ස්වකීය අරමුණ වෙනුවෙනි. එහිදී එක්සත් ජනපදය තම මිතුරාව ආරක්ෂා කරයි. මේ නොපනත්කමට එරෙහිව එක්සත් ජනපද කොංග්‍රසයේම හඬවල් මතුවෙමින් තිබේ. Betty McCollum එහි පෙරමුණේය.

බෙටි මැකෝලම් සෑම වසරකම වොෂින්ටනය ඊශ්‍රායලයට යවන ඩොලර් බිලියන ගණන පිළිබඳව එක්සත් ජනපදයේ විවාදයක් ඇති කිරීමට උත්සාහ කර තිබේ. පලස්තීනුවන්ට එරෙහිව මානව හිමිකම් උල්ලංඝනය කිරීම් සඳහා ඊශ්‍රායලය එක්සත් ජනපද මිලිටරි ආධාර භාවිතා නොකරන බවට සහතික වීම ඇයට අවශ්‍ය අතරම මෙම මුදල් යන්නේ කොතැනටද යන්න ගැන වැඩි විස්තර දැනගැනීමටද ඇයට අවශ්‍යය.

ඇය පලස්තීන දරුවන්ට එරෙහි අපයෝජනයන්, පලස්තීන දේපළ විනාශ කිරීම, වාඩිලාගෙන සිටින බටහිර ඉවුරෙන් පලස්තීනුවන් ඉවත් කිරීම හෝ පලස්තීන ඉඩම් තවදුරටත් අත්පත් කර ගැනීමට ඊශ්‍රායලය දරන උත්සාහයන් සඳහා එක්සත් ජනපද ආධාර භාවිතා නොකරන බවට සහතිකයක් ලබාගැනීම අරමුණු කරගත් සිය නවතම පනත පසුගිය මාසයේ හඳුන්වා දුන්නාය. එහෙත් එය සම්මත කිරීමට ප්‍රමාණවත් ඡන්ද ප්‍රමාණයක් නොතිබුණි.

නව වටයකින් මෙම පනත නැවත මතුවෙමින් පවතී. ඒ පවුල් කිහිපයක් ඉවත්කිරීමට ඊශ්‍රායල බලධාරීන් තර්ජනය කිරීම නිසා ඇති වූ පලස්තීන ජනතාවගේ විනාශය මධ්‍යයේය. ඉන් ළමා මරණ 52ක් සමඟ පලස්තීනය අහිමිකරගත් මිනිස් ජීවිත ගණන 202කි. තුවාලකරුවන් ගණනද 1800 ඉක්මවයි.

ඒ බිහිසුණු හානියට පසුවත් හමාස් සංවිධානය ඔවුහු තමන් යුද්ධයේ 'ජයග්‍රාහයකයන්' බව පැවසූහ. හමාස්හි මිලිටරි 'යටිතල පහසුකම්' යැයි කියූ දේ ඉලක්ක කරගනිමින් ඊශ්‍රායලය සිය ගණනක් ගුවන් ප්‍රහාර දියත් කර ඇත.

හමාස් සහ අනෙකුත් සටන්කාමී කණ්ඩායම් ඊශ්‍රායලයට රොකට් 4,000කට වැඩි ප්‍රමාණයක් වෙඩි තැබූ අතර, ඊශ්‍රායල නගරවල ආරක්ෂක මිසයිල බාධක කොතරම් තිබුණද ඒවා මගහරිමින් රටේ වාණිජ අගනුවර වන ටෙල් අවිව් දක්වා රොකට් දුසිම් ගණනක් උතුරට පියාසර කළේය. එමඟින් ඊශ්‍රායල කුඩා දරුවන් දෙදෙනෙකු සමඟ නැති කරගත් ජීවිත ගණන 12කි. තුවාලකරුවෝ 900කි.

පැරිස්හි මූලෝපායික පර්යේෂණ සඳහා පදනමේ ජ්‍යෙෂ්ඨ සාමාජිකයෙකු වන ඇග්නස් ලෙවලොයිස්ට අනුව මෙසේයි,

"හමාස් සංවිධානයට අවශ්‍ය දේ ලැබුණා: මෙතෙක් ගාසා තීරයට පමණක් සීමා වී තිබූ හමාස්, ජෙරුසලමේද ආරක්ෂකයා ලෙස පෙනී සිටී".

"එමෙන්ම තම දූෂණ නඩු විභාගය සහ අවිනිශ්චිත මැතිවරණයෙන් පසු නව රජයක් පිහිටුවීමට ගත් උත්සාහයන් අසාර්ථක වී එම්බාම්ව සිටි විට නෙතන්යාහු ඊශ්‍රායලයේ 'ශක්තිමත් මිනිසා' ලෙස තම ස්ථාවරය තහවුරු කරගැනීමටත්, ඔහුගේ දේශපාලන බිම ආරක්ෂා කර ගැනීමටත් ප්‍රමාණවත් තරම් ලකුණු ලබාගෙන ඇති බව වටහා ගත්තේය. එය සෑමවිටම මෙම මෙහෙයුමේ ප්‍රධාන අභිප්‍රායන්යගෙන් එකක් විය."

එහෙත් ඔහුගේ මෙහෙයුම පලස්තින සිවිල් වැසියන්ට, විශේෂයෙන් ළමයින්ට සිදුවන බිහිසුණු අපරාධ සංඛ්‍යාව අනුව ඔහු ලෝකයේ දැඩි පීඩනයකට හා අප්‍රසාදයකට ලක්ව ඇති නායකයෙක් බවට පත්කර ඇතැයිද ඇග්නස් ලෙවලොයිස් පැවසීය.

ඊශ්‍රායල් අගමැති "සියල්ලම සංවිධානය කළේ නැත - එය ඔහුට වඩා විශාලයි, නමුත් ගැටුම නිසැකවම ඔහුට ජීවයක් ගෙන දුන්නේය." ප්‍රංශ 24 චැනලය කියා තිබිණි.

ඒ අතරතුර නෙතන්යාහු නොමැති සන්ධානයක් ඇති කරගැනීමට නෙතන්යාහුගේ ප්‍රතිවාදීන් දැරූ උත්සාහයන් දින 11ක යුද්ධය එළදායී ලෙස මග හැරගිය අතර, ඔහුගේ අවුරුදු 12ක පාලනය තවත් දීර්ඝ කිරීමේ අවස්ථාව සැලකිය යුතු ලෙස ඉහළ නංවා තිබේ. එහෙත් සටන් විරාමය මගින් ඉතා ඉක්මණින් සටන නවතා දැමූ බවට ඔහුගේ සහචරයන් මෙන්ම, ජාතිකවාදී පදනමෙන් කෝපාවිෂ්ටව සිටින ප්‍රතිවාදීන්ටද ඔහු ගොදුරු වෙමින් සිටී.

නෙතන්යාහුට විරුද්ධව කුඩා පක්ෂයකට නායකත්වය දෙන හිටපු සගයෙකු වන ගිඩියොන් සාර් (Gideon Saar) සටන් විරාමය "ලැජ්ජාවට කරුණක්" ලෙස හැඳින්වූ අතර අන්ත දක්ෂිණාංශික යුදෙව් බල පක්ෂයේ දැඩි මතධාරී නායකයෙක් වන ඉතමාර් බෙන් ග්විර් (Itamar Ben Gvir) එය විස්තර කළේ හමාස්හි නියෝගවලට බරපතල ලෙස යටත්වෙමින් නෙතන්යාහු යුද්ධය නවතා දැමීම තවදුරටත් ත්‍රස්තවාදය පෝෂණය කර වූ බවයි.

"සෑම වසර කිහිපයකට වරක්, ඊශ්‍රායලය ගාසා තීරයේ නව මෙහෙයුමක් ආරම්භ කරයි. එහෙත් ස්ථිර මිලිටරි අරමුණු සහ කළ නොහැකි දේශපාලන අභිලාෂයන් අතර ඇති විෂමතාවය හා එය ගැටෙයි. ඇග්නස් ලෙවලොයිස්ට අනුව ඊශ්‍රායලයට හමාස් සංවිධානය අතුරුදහන් කිරීමට නොහැකිය. මන්දයත් ගැටලුව මිලිටරි එකක් නොවේ -එය දේශපාලනිකය."

අවසානයේදී නෙතනායිහුගේ රජය "ගුවන් ප්‍රහාරවලින් වැඩි යමක් අත්කර ගත නොහැකි බවත් ඔබ පුළුල් කිරීමට යන්නේ නැතිනම් දැන් පසුබැසීමට කාලය පැමිණිය යුතු බවත්" ඊශ්‍රායල හමුදාවේ උපදෙස් පිළිගත්තේය. මේ සඳහා දේශපාලන විසඳුමක් සෙවීමටද ඔහු අපොහොසත් විය. දේශපාලන විසඳුමක් සෙවීමට අපොහොසත් වීම නුදුරු අනාගතයේදී අනිවාර්යයෙන්ම තවත් ගිනි ජාලාවක් ඇති කිරීමට හේතු වනු ඇතැයි යනුවෙන් ප්‍රාන්ස් 24හි ජෙරුසලමේ වාර්තාකරු අයිරිස් මැක්ලර් පැවසීය.

"එය ඊශ්‍රායලය හා හමාස් ගැන පමණක් නොවේ; එය ඊශ්‍රායලය සහ පලස්තීනුවන් අතර ඇති සම්බන්ධතාවයේ සමස්ත ප්‍රශ්නයම විසඳිය යුතුය. ඔවුන් නැවත සාකච්ඡා මේසයට නොගියහොත් යුද්ධය නැවත පැමිණෙනු ඇත".

] උපාලි ජයසිංහ [

වමට

# ඩිජිටල් ශ්‍රමය හා අධිරාජ්‍යවාදය

අධිරාජ්‍යවාදී අවධිය තුළ ශ්‍රමය හා ශ්‍රමයේ නිෂ්පාදන, මිනිස් අවශ්‍යතා තාක්‍ෂණයේ වර්ධනය මගින් පෙරට වඩා වෙනස් කර තිබේ.

අන්තර්ජාලය හා තොරතුරු තාක්‍ෂණය සම්බන්ධ භාණ්ඩ හා සේවා නිෂ්පාදනය ලෝක ශ්‍රම බලකායෙන් සැලකිය යුතු පිරිසක් යොදවා ගෙන ඇත.

ඩිජිටල් නිෂ්පාදන කරන සමාගම් ලොවපුරා බිහිවී ඇති අතරම මෙම සමාගම් සමග සෘජුවත් වක්‍රවත් සම්බන්ධ වී ඩිජිටල් නිෂ්පාදන සඳහා ශ්‍රමය වගුරන දසලක්‍ෂ සංඛ්‍යාත ඩිජිටල් ශ්‍රමිකයන් පිරිසක් බිහිව සිටී.



ඔවුන්ගේ ශ්‍රමය වැගිරීමත්, ඔවුන්ට හාම්පුතුන් සමඟ ඇති සබඳතාවයත්, ඔවුන්ගේ සේවා කොන්දේසිත්, ඔවුන් වැඩකරන ස්ථාන හා පරිසරයත්, ඔවුන්ගේ වෘත්තීය සමිති ක්‍රියාකාරීත්වයත්, ඔවුන්ගේ රැකියා සුරක්ෂිතතාවයත් මුළුමනින්ම පාහේ මෝටර් රථ නිෂ්පාදන හෝ භාණ්ඩ අලෙවි සමාගමක සේවකයන්ට වඩා වෙනස්ය.

එබැවින් අධිරාජ්‍යවාදී අවධිය තුළ ඩිජිටල් නිෂ්පාදන සඳහා තම ශ්‍රමය වගුරන ඩිජිටල් කම්කරුවන් හා ඔවුන්ගේ ඩිජිටල් ශ්‍රමය පිළිබඳ මාක්ස්වාදී කියවීමක් අවශ්‍ය වේ. මන්දයත් 4 වැනි කාර්මික විප්ලවයට මුහුණ දී සිටින මිනිස් සමාජය තුළ ඉදිරි දශක දෙක තුළ බොහෝ ක්‍ෂේත්‍ර මෙම ඩිජිටල් ශ්‍රමයේ සෘජු බලපෑමට ලක්වන නිසාත්, ඉදිරියේ බිහිවන නව රැකියා වැඩි ප්‍රමාණයක් ඩිජිටල් රැකියා වීමත් නිසාය.

අධිරාජ්‍යවාදය පිළිබඳ එහි මුල්ම යුගයේ ප්‍රධාන න්‍යායික පැහැදිලි කිරීම් කළ මාක්ස්වාදීන් වන ලෙනින්, බුහාරි හා රෝසා ලක්‍ෂම්බර්ග් යන තිදෙනාම අධිරාජ්‍යවාදයේ එක් කේන්ද්‍රීය ලක්‍ෂණයක් ලෙස දුටුවේ ශ්‍රම විභාජනය ජාත්‍යන්තර මට්ටමෙන් සිදුවීමය.

භාණ්ඩ අපනයනයට වඩා මූල්‍ය ප්‍රාග්ධනය අපනයනය කිරීම අධිරාජ්‍යවාදයේ ප්‍රධාන ලක්‍ෂණයක් ලෙස ලෙනින් හඳුනාගත්තේය.

"ධනපති ක්‍රමය ධනපති ක්‍රමය වශයෙන් පවතින තාක්කල් අතිරික්ත ප්‍රාග්ධනය යොදනු ලබන්නේ කිසියම් රටක ජනතාවගේ ජීවන තත්වය උසස් කිරීම සඳහා නොවේ. එයින් ධනපතියාගේ ලාභ අඩුවීමක් අදහස් වන හෙයින් එසේ නොකරනු ලැබේ. එය යොදනු ඇත්තේ ප්‍රාග්ධනය විදේශ නොදියුණු රටවලට අපනයනය කිරීමෙන් ලාභ වැඩිකිරීමේ අරමුණු ඉටුකරගැනීම සඳහාය. මෙම නොදියුණු රටවල ප්‍රාග්ධනය දුර්ලභ නිසා ඉඩම් මිල සංසන්දනාත්මක වශයෙන් අඩු නිසාද, වේතන අඩු නිසාද, ද්‍රව්‍ය මිල අඩු නිසාද, සත්‍ය වශයෙන් එහි ලාභද අධික නිසාය" (අධිරාජ්‍යවාදය- ධනපති ක්‍රමයේ ඉහලම අවධිය - ලෙනින්, 04 වෙළුම, පිටුව 91)

මේ අනුව ඩිජිටල් ශ්‍රමය යනු අවසාන අදියරේදී තොරතුරු තාක්‍ෂණ උපකරණ තුළ "ඩිජිටල් අඩංගුව" නිපදවන කම්කරුවන් පමණක් නොවේ. එබැවින් ඩිජිටල් ශ්‍රමය යනු කෘෂිකාර්මික, කාර්මික හා තොරතුරු තාක්‍ෂණ ශ්‍රමය යන අංගත්, ඩිජිටල් මාධ්‍යයත් යොදාගෙන සිදුකරනු ලබන හා එසේ පමණක් සිදුකළ හැකි ශ්‍රම ක්‍රියාවලියකි. මෙය තවදුරටත් පැහැදිලි කළහොත් මෙම ඩිජිටල් නිෂ්පාදන සඳහා දායක වන ශ්‍රමිකයන් පතල් කම්කරුවන්, ඛනිජ සකස්කරන්නන්, එකලස් කරන්නන් හා තොරතුරු තාක්‍ෂණ කම්කරුවන් මෙම නිෂ්පාදන ක්‍රියාවලියේ නිශ්චිත නිෂ්පාදන සම්බන්ධතාවයන් නිරූපණය කරයි.

වර්තමානයේ ගෝලීය ප්‍රමාණයෙන් යුත් මෙම සංකීර්ණ ඩිජිටල් ශ්‍රම වෙළෙඳපොළ සකස් වී ඇත්තේ කෙසේද? එහි ශ්‍රමිකයන් කාණ්ඩ ගණනාවක් වෙයි.

- වැටුප් ශ්‍රමිකයන්,
- වහල් ශ්‍රමිකයන්,
- අඩ වැටුප් ලබන ශ්‍රමිකයන්,
- ඉතා අනතුරුදායක හා අප්‍රසන්න වැඩබිම්වල සිට කටයුතු කරන ශ්‍රමිකයන්,
- ස්වයං රැකියා කරන්නන්

මෙවැනි එකිනෙකට හා සම්බන්ධ වූ ශ්‍රමික කණ්ඩායම් රාශියකින් මෙම ශ්‍රම විභජනය සිදුකර තිබේ.

මෙම දාමය විසින් සූරාකෑමේ ඉහළ කාර්යක්‍ෂමතාවයකින් යුත් යාන්ත්‍රණයක් සකස් කර තිබේ. එය

- කොංගෝවේ ඛනිජ ආකර තුළ තොරතුරු තාක්‍ෂණික උපකරණ නිපදවීම සඳහා අවශ්‍ය වන ඛනිජ සපයන වහලුන් ලෙස කටයුතු කරන ශ්‍රමිකයාද

- තායිවානයේ Foxconn සමාගම්හි උපරිම සූරාකෑමට ලක්වන වැටුප් ශ්‍රමිකයන්ද

- ඉන්දියාවේ අඩු වැටුපකට වැඩකරන මෘදුකාංග ඉංජිනේරුවන්ද

- ගූගල් හා බටහිර සමාගම්හි අධික පීඩනයක් යටතේ ඉහළ වැටුප්වලට වැඩකරන මෘදුකාංග ඉංජිනේරවරුන්ද

- ඩිජිටල් නිෂ්පාදන හා සංස්කෘතිය ව්‍යාප්ත කරන අතිශය පීඩාකාරී හා නාස්තිකාරී ජීවන චර්යාවන්ට ගොදුරු වී සිටින නිදහස් ක්‍රියාකරුවන්ද

- අධික විෂ රසායනිකවලට නිරාවරණය වෙමින් භාවිත කර අවසන් වූ ඩිජිටල් උපකරණ ගලවා අපද්‍රව්‍යය කළමනාකරණයට යොමු කරන ඩිජිටල් අපද්‍රව්‍යය ඉවත් කරන සේවකයන්ද

වශයෙන් මෙම ජාත්‍යන්තර ඩිජිටල් ශ්‍රම විභේදනය සිදුවී ඇත.




# අධ්‍යාපනයට අනින අලුත්ම විස කටුව...
# "කොතලාවල පනත"

මේ දවස්වල ගොඩක් අය කතා වෙන මාතෘකාවක් තමයි "කොතලාවල පනත" කියන්නේ. මේ විනාශකාරී පනත මුලින්ම ඉදිරිපත් කළේ 2018 රනිල් - මෛත්‍රී ආණ්ඩුවයි. ඒත් ඒ කාලෙදි ගෙනාපු මේ වගේ රටට අහිතකර යෝජනා සහ ක්‍රියාමාර්ග තමන්ගේ පාලනයක් යටතෙදි නම් අහෝසි කරනවය කියලා බලයට පත් වුණු වර්තමාන ආණ්ඩුවත් නැවත වතාවක් මේ පනත කර තියාගෙන ඇවිත් ඉන්නවා. අද හැමෝම මේ පනත ගැනත් ඊට එරෙහි සටන ගැනත් කතා වුනාට සමහරුන්ට මේ පනත ගැන නිරවුල් අදහසක් නැහැ. ඒ නිසා ඒ ගැන තේරුම් ගන්න පහසු වෙන්න ඉතාම සරලව යම් කාරණා කිහිපයක් ඉදිරිපත් කරන්න ඕනා කියලා අපි හිතුවා. විශේෂයෙන්ම අපි මේ පනතට විරුද්ධ වෙන්නෙ ඇයි කියන කාරණයත් එම යෝජිත පනත සම්මත කිරීම තුළින් අපේ රටේ නිදහස් අධ්‍යාපනයට සිදු විය හැකි බලපෑම ගැනත් ප්‍රධාන කරුණු හතරක් ඔස්සේ සාකච්ඡා කරන්න හැකියි.

01. අධ්‍යාපනය පෞද්ගලිකරණය කිරීම.

■ රාජ්‍ය සේවයේ නියුතු වීමට අපේක්ෂා කරන අයට සහ වෙනත් අයටද උපාධි ප්‍රදානය සිදු කරන අතර ඒ සඳහා මුදල් අයකරයි.

■ 1978 අංක 16 දරණ විශ්වවිද්‍යාල පනත නොසලකා උපාධි ප්‍රදානය කිරීමේ බලය හිමි වී ඇත. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව සතු බලතලම කොතලාවල විශ්වවිද්‍යාලයට ද හිමි වේ.

■ දේශීය සහ විදේශීය උසස් අධ්‍යාපන ආයතන සමඟ අනුබද්ධව කටයුතු කළ හැක.

■ දේශීය සහ විදේශීය උසස් අධ්‍යාපන ආයතන සමඟ සිසුන් හුවමාරු කිරීමේ බලය ඇත. මෙමඟින් ලංකාවේ වෙනත් උපාධි කඩවලට ද පිළිගැනීමක් ලබාදිය හැකියි.

■ කොතලාවල විශ්වවිද්‍යාලයට අනුබද්ධව මණ්ඩප සහ පීඨ ආරම්භ කළ හැක.

02. අධ්‍යාපනයට දේශපාලන මැදිහත්වීම් සිදු කළ හැකි වීම.

■ විධානය සහ පරිපාලනය සම්බන්ධ ප්‍රධානියා ආරක්ෂක අමාත්‍යවරයායි.

■ පාලක මණ්ඩලය විසින් අමාත්‍යවරයාගේ විධාන ක්‍රියාත්මක කිරීමට බැඳී සිටියි.

■ යමක් හේතුවෙන් ජාතික ආරක්ෂාවට අනතුරුදායක හෝ ජාතික ප්‍රතිපත්තිවලට අහිතකර හෝ අගතිදායක දෙයක් සිදුවනවා යැයි ඇමතිවරයාට හැඟෙන විට එය පාලනය කිරීමට කළ හැකි ඕනෑම දෙයක් සිදු කිරීමට අවසර දී ඇත. (උදා: විශ්වවිද්‍යාලයේ ශිෂ්‍යයෙක් විසින් පළ කරනු ලබන ෆේස්බුක් පෝස්ට් එකක් හේතුකොට ගෙන ශිෂ්‍යභාවය අහෝසි කිරීමට පවා බලයක් ඇත.)

■ උපකුලපතිවරයා පත්කිරීම සහ ඉවත් කිරීමට ජනාධිපතිවරයා සතුව තනි බලයක් ඇත.

03. අධ්‍යාපන මිලිටරිකරණය.

■ උපකුලපතිවරයා සහ නියෝජ්‍ය උපකුලපතිවරයා (ආරක්ෂක සහ පරිපාලන) මිලිටරි නිලධාරීන් වේ. ඔවුන්ගේ අධ්‍යාපන සුදුසුකම් වෙනුවට හමුදා නිලය පමණක් සලකයි.

■ පාලක මණ්ඩලයේ සාමාජිකයින් නවයෙන් හතක්ම මිලිටරි නියෝජිතයන් වන අතර ඉතිරි තිදෙනාගෙන් එක් සාමාජිකයෙක් පමණක් උසස් අධ්‍යාපන ක්ෂේත්‍රය නියෝජනය කරයි.

■ යුධ, නාවුක සහ ගුවන් හමුදාවල විනය නීතිද අදාළ වේ.

■ ජාතික ආරක්ෂාව වෙනුවෙන් යැයි පවසමින් සිසුන්ගේ පෞද්ගලික තොරතුරු පවා ලබාගැනීම සඳහා විශ්වවිද්‍යාල පරිපාලනය සතුව අනීතිමය බලතල ඇත.

04. අධ්‍යයනයේ නිදහස අහෝසි කිරීම.

■ ශිෂ්‍ය සංගම් පිහිටුවීමට අවසර නැත.

■ ආචාර්ය, මහාචාර්යවරුන් පවා හමුදා නීතියට යටත්ය.

■ ආණ්ඩුවේ ක්‍රියාමාර්ග විවේචනය කිරීමට ඊට අනුබද්ධ ආචාර්ය මණ්ඩලයට, ශිෂ්‍යයින්ට, අනධ්‍යයන සේවකයින්ට හෝ කිසිවෙකුට හෝ අයිතියක් නැත.

■ සිසුන්ට පීඨ මණ්ඩලයට සහභාගී විය නොහැක.

ඉතින් මේ යෝජිත පනත තුළ අන්තර්ගත සැබෑ වුවමනාව මොකක්ද කියලා ඔබට වැටහෙනවා ඇති. කොහොම වුනත් මොනම තත්වයක් යටතේ වුනත් මෙවැනි යෝජනාවකට ඔබ එකඟ වෙනවා කියන්නෙම ඒක මේ රටේ අධ්‍යාපන පෞද්ගලීකරණයටත්, මිලිටරිකරණයටත් කරන ආශිර්වාදයක්ම මිසක් වෙන කිසිවක්ම නෙවෙයි. ඒ නිසා නිදහස් අධ්‍යාපනයේ ඵල ලැබූවන් ලෙස අනාගතයටත් ඒ නිදහස් අධ්‍යාපනයේ අයිතිය රැක දීම ඔබ අප කාගේත් යුතුකමයි. මොකද රටක අධ්‍යාපනයට විෂ පොවනවා කියලා කියන්නේ ඒ රටේ සමස්ත අනාගතයම ලෙඩ වෙනවා කියන එකයි. ඒ නිසා මේ පනතට එරෙහිව නගන හඬට ඔබේ හඬත් එකතු කරලා අපේ රටේ අධ්‍යාපනයත්, අනාගතයත් රැක ගැනීම සඳහා ගෙන යනු ලබන සටනේ පංගුකාරයෙකු වීමට ඔබ තවමත් ප්‍රමාද නැහැ.

# ආගම දේශපාලනයෙන් වෙන්කළ යුතුයි!

*කැළණිය විශ්වවිද්‍යාලයේ කථිකාචාර්ය*
***පූජ්‍ය කැකිරාවේ සුදස්සන හිමි***



**හාමුදුරුවනේ ඔබ වහන්සේ ගැන හැඳින්වුවොත්?**

මම කැකිරාවේ සුදර්ශන හිමි. මම කැළණිය විශ්වවිද්‍යාලයෙ කථිකාචාර්යවරයකු ලෙසත් මිල්ලක්කර සිරි සුමංගල විද්‍යාලයේ ආචාර්යවරයකු ලෙසත් කටයුතු කරනවා.

**ලංකාවේ සිදු වූ ඉතාමත් කෲර අපකීර්තිමත් සිද්ධියක් වූ කළු ජූලිය පිළිබඳ ඔබ වහන්සේට ඇති අදහස කුමක්ද?**

ස්වාමින් වහන්සේ නමක් ලෙසත් බුද්ධ පුත්‍රයෙක් ලෙසත් මෙම කළු ජූලිය පිළිබඳව මට ඇත්තේ ඉතාමත් සංවේගජනක, සිදුනොවිය යුතු සිදුවීමක් ලෙසයි. මේ සඳහා නොයෙකුත් සිංහල ජාතිවාදී කණ්ඩායම් සහ දේශපාලකයන් සමහර භික්ෂූන්ගෙන් සැදුම්ලත් පිරිසකගේ ඉතා අපකීර්තිමත් මැදිහත්වීමක සිදුවීමක් ලෙස මෙය හඳුන්වන්න පුලුවන්.

මම දැඩි පිළිකුලෙන් යුතුව හෙළා දකිනවා ලංකාවේ සමහර ස්වාමීන් වහන්සේලා වන ගලබඩඅත්තේ ඥානසාර සහ ඔහු වටා කේන්ද්‍ර වී ඇති ජාතිවාදී, ආගම්වාදී භික්ෂූන් සහ ඩෑන් පියසාද් වැනි ජාතිවාදී, ආගම්වාදී පුද්ගලයන්ගේ නූතන ක්‍රියාවන්. තවමත් කළු ජූලිය පිළිබඳ නිසි කියවීමක් නොමැතිබව මෑතක පවතින යුධමය සාධක, ජාතිවාදී සාධක, ආගම්වාදී සාධක මගින් හෙලිවෙනවා.

**ලංකාවේ ඇති ජනවාර්ගික ප්‍රශ්නයට විසඳුම ලෙස ඔබ වහන්සේ ළඟ ඇති යෝජනාව කුමක්ද?**

මේ රට වසර දෙදහස් පන්සීයක පමණ සිංහල බෞද්ධ සංස්කෘතියකට උරුමකම් කියන රටක්. එම සිංහල බෞද්ධ සංස්කෘතිය ගැන විමසද්දී අපට පෙනී යන දෙයක් තමයි බුදුහාමුදුරුවන්ගේ චරිතය, දේශනා පිළිබඳ පිළිපදින ජන කොට්ඨාසයක් සිටින රටක් විදියට මෙතරම් අවිහිංසාවාදී දහමක් ඇතුලේ මෙවැනි ආකාරයේ ජාතිවාදී සංහාර සිදුවුණේ කෙසේද කියන කාරණාව. මේවට විසඳුම් සොයන විට අපට දක්නට ලැබෙන්නේ නිදහසෙන් පසු බිහිවූ දේශපාලන කණ්ඩායම් විසින් ආගමික සම්ප්‍රදායයන්, භික්ෂුව, විහාරස්ථානය යන සියලු දේ තම දේශපාලනය සඳහා යොදා ගැනීම තුළින් දේශපාලන අභිලාෂයන් මුදුන් පමුණුවා ගැනීමක්. ආගම දේශපාලනයට සම්බන්ධ කරගැනීමක්. දේශපාලනය හරහා සිදුකරනු ලැබූ ඉතා අයහපත් ක්‍රියාදාමයන් පවිත්‍රත්වයට පත් කිරීම සඳහා ආගම යොදාගනිමින්, ජාතිවාදය, ආගම්වාදය වපුරමින් කළු ජූලිය වැනිම සිදුවීම් දාමයක් රට තුළ සිදුවුණා.

හැබැයි බුදුහාමුදුරුවන්ගේ නියම බුද්ධ ධර්මය ගවේෂණය කරද්දි අපට තේරෙන දේ තමයි, එම බුද්ධාගමේ නාමයෙන් නොයෙකුත් කල්ලි කණ්ඩායම් විසින් සිදුකරනු ලැබූ එවැනි ක්‍රියාදාමයන් බුදුහාමුදුරුවන් විසින් දේශනා කරනු ලැබූ බුද්ධ ධර්මයට අතිශය විරුද්ධව සිදු වූ ක්‍රියාදාමයන් බව. නිවැරදි බුදුදහම කියන්නෙ ආගම්වාදය, ජාතිවාදය, ගෝත්‍රවාදය, කුලවාදය ප්‍රතික්ෂේප කරනු ලැබූවක්. සියලු සත්වයන්ට මෛත්‍රිය කරුණාව දැක්වූ දහමක් තුළ මෙවැනි සිදුවීම් සිදුවිය නොහැකියි. නියම බුදුදහම පිළිපදින්නන් ලෙස අපට සිංහල, දෙමළ, මුස්ලිම් ලෙස බෙදීයාමට හැකියාවක් නැහැ. බුදුන්ගේ දහම සියලු ජාතීන්ට අයත්. මේ රටේ ඇති ජාතිවාදය, ආගම්වාදයට විසඳුම් ලෙස බුදුදහමෙන් ගත හැකි ආදර්ශයන් ඉතා බොහෝයි. නිවැරදි බුදුදහම මත පිහිටා තිබුණේ නම් තිස් අවුරුදු යුද්ධයක් හෝ ඉතා මෑත කාලීනව පැන නැගුණු ආගම්වාදී සිදුවීම් පවා සිදු නොවීමට ඉඩ තිබුණා. එනිසා මම යෝජනා කරන්නේ ආගම දේශපාලනයෙන් වෙන්කර බුදුදහමේ නමින් සිදුකරන ජාතිවාදී ආගම්වාදී සිදුවීම් නවතා, නිවැරදි බුදුදහම මෙම භූමිය තුළ සනිටුහන් කරන ලෙස.

---

# දියුණු පොදු වැඩපිළිවෙළක් හරහා තමයි අපිට ජාතික සමගිය ගොඩනැගිය හැකි වෙන්නේ.



## මුනීර් මවුලවි

**මේ රට පිළිබඳ ඔබගේ වර්තමාන කියවීම කුමක් ද?**

දේශපාලන වශයෙන් බංකොලොත්, රටට ආදරේ නැති පිරිස් ගත් සමහර ඔලමොට්ටල තීරණ නිසා අපේ රට අවුරුදු 30ක කුරිරු යුද්ධයකට තල්ලු වුණා. අපි අතීතයෙන් පාඩම් ඉගෙන නොගෙන බලය වෙනුවෙන් ජාතිවාදය වපුරන, ආගම් අතර විරසකය ඇති කරන සමාජයකයි ජීවත් වෙන්නේ. වසර 73ක් තිස්සේ සංවර්ධන වැඩපිළිවෙළක් ඉදිරිපත් කරනවා වෙනුවට පාලකයෝ කළේ ජාතිවාදය වපුරමින් ජනතාව අසමගි කිරීම. මං හිතන්නේ බහුතරයක් ජනතාවට දැන් තේරෙනවා ජාතිය, ආගම, භාෂාව මුල්කරගෙන ප්‍රශ්න ඇති කරේ වෙන කිසිවකටත් නෙවේ, තමන් සතු බලය තමන් ළඟම තියා ගන්න කියලා. තරුණ අය විදියට අපිට වගකීමක් තියෙනවා. මේවාට එරෙහිව වැඩකිරීම අද අත්‍යවශ්‍ය කාරණයක්. කෙනෙකුට හිතන්න පුළුවන් මේ ආණ්ඩුව ආවම එහෙම ගැටුම් ඇති වුණේ නෑ කියලා. හැබැයි ඔවුන්ට පුළුවන් ඕනිම වෙලාවක ඒක මතු කරලා ගන්න. සබුද්ධිකව කල්පනා කරමින් ඔවුන්ගේ උගුල්වලට නොවැටී ඇත්ත අර්බුදය තේරුම් ගෙන කටයුතු කළ යුතු කාලයක් මේක.

**මේ රටෙහි ජාතික සමගිය ඇති කිරීම සඳහා ඔබේ යෝජනාව කුමක් ද?**

මාධ්‍යයන්ට විශාල වගකීමක් තියෙනවා. ඔබ මේ වපුරන දේ නිසා කවදා හරි ඔබට හානි වෙන්න පුළුවන්. අල් කුරාණයේ පැහැදිලි කරනවා අපි හැමෝටම පැවතෙන්නෙ එකම මූලාශ්‍රයකින් කියලා. විවිධ වෙනස්කම් තියෙන්න පුළුවන්. ඒවා අවබෝධ කරගන්න ඕනා. ඒ අවබෝධය හදාගන්න අද තියෙන ඉඩ ඉතාම විරලයි. මේ සියලු වෙනස්කම් පසෙකලා සියළු දෙනාට සමානව සාධාරණව සැලකිය යුතුයි කියන උතුම් පරමාර්ථය ඇතිව වැඩ කරන පිරිස් බලයට එනතුරු අපිට මේ අර්බුදය ජයගන්න බැහැ. මේ සිස්ටම් එකම ෆේල්. මොන මැජික්කාරයා ආවත් මේක ගොඩනගන්න බෑ. පාස්කු ප්‍රහාරයත් එක්ක ජනතාව අතර බෙදීමක් ඇති වෙලා තියෙනවා. ඒ බෙදීම සුවපත් කරන්න රජය හෝ වෙනත් කණ්ඩායම් වැඩ කළේ නෑ. දියුණු පොදු වැඩපිළිවෙළක් හරහා තමයි අපිට ජාතික සමගිය ගොඩනැගිය හැකි වෙන්නේ. මාධ්‍ය, දේශපාලනය එයට සම්බන්ධ විය යුතුයි. ඒ වගේම පුරවැසියෙක් ලෙස තමන්ගේ වගකීම ඉටු කළ යුතුයි. ආගමික නායකයින් ලෙස අපිත් අනෙකා කෙරෙහි ගෞරවය ඇතිවන ලෙස කටයුතු කළ යුතුයි.

# සහෝදරත්වයේ

























# මතකයන් කාචඇසින්


2018


2019



2013


2014


2017


සමාජවාදී තරුණ සංගමය
SOCIALIST YOUTH UNION
2016
2016


සිංහල,
2019


Multi · Colours · One Country
2016


2015


2015


සහෝදරත්වයේ දිනය

කරක් ගහපු තැන

# සබරගමුව හැඩ කරන දුනුමාල ඇල්ල


සියනෑවේ කුල කුමරියක් වශයෙන් බොහෝදෙනා හැඳින්වුවද ඇය නිශ්චිතව සබරගමුවේ දියණියකි. ඒ සබරගමු පළාත් සීමාමායිම තුළ පිහිටි නිසාය. ඇල්ලෙහි ඉහළ කොටස දුනුමාල ගම්පියසට අයත් වීම නිසා දුනුමාල නමින්ද පහළ කොටස උඩුවක ගම්මානයට අයත් වීම නිසා උඩුවක ඇල්ල නමින්ද මෙම ඇල්ල ප්‍රචලිතයි. නයගරා ඇල්ලට සමාන ශ්‍රී ලංකාවේ ඇල්ල මෙයදෝ යැයි හැඟෙන්නේ ඒ නිසාය. උඩුවක ගම්මානය බෝපොල යනුවෙන්ද හඳුන්වන බැවින් බෝපොල ඇල්ල ලෙසින්ද නම් දරා ඇත.

දුනුමාල ඔයෙන් පෝෂණය වන දුනුමාල ඇල්ල අඩි 40ක් පමණ උසය. මෙම ඇල්ල උසට සාපේක්ෂව වැඩි වපසරියක ජල කඳක් පහළට මුදාහරින නිසා බේකර්ස් ඇල්ලට සමාන බවක්ද පෙන්වයි. මේ නිසාම 'ගම්පහ බේකර්ස් ඇල්ල' ලෙස සංචාරකයන් අතර ප්‍රකටව තිබේ. ඇල්ල දුටු විගසම එහි සොබාසිරියෙන් මනසට ඇතිවන සැහැල්ලුව වචනයෙන් කිව නොහැක. ස්තර දෙකකට ගලා බසින මේ ලලනාවිය සැබැවින්ම සුන්දරත්වයේ සංකේතයකි. අඩි පහක පමණ ගල්තලාවකින් පළමුව වැටී නැවතත් පොළොව සිපගන්නා අයුරින් බිමට ඇදහැලීම ඇගේ ස්වභාවයයි. දියඇල්ලක් ලෙස දර්ශනය වන්නේ දෙවනුව ජලය පහළට ඇදහැලෙන ප්‍රදේශයයි. මෙසේ ජල කදම්භය පහළට වැටීමේදී සංයුක්ත ගල් තලාවෙහි එක් කොටසකට නැවත ජලය කඩා හැලීමෙන් විටෙක එය මහල් තුනකින් සමන්විත බව හැඟෙනු ඇත.

මෑතක් වන තුරුම මිනිසුන් අතර එතරම්ව ජනප්‍රිය නොවූ මේ සොඳුරිය දැකබලා ගැනීමට මිනිසුන් පැමිණෙන්නේ සිරිපැරකුම් චිත්‍රපටිය රූගත කිරීමත් සමඟය. ඒ හේතුවෙන් 'සිරිපැරකුම් ඇල්ල' ලෙසින්ද ඇතැමුන්ගේ මුවගෙහි රැඳී තිබේ. අනෙකුත් දියඇලිවලට සාපේක්ෂව මෙහි ඇති විශේෂත්වය නම් ඈ අසලටම ගොස් සුන්දරත්වය විඳිය හැකි වීමය. ඇල්ල පාමුල නොගැඹුරු කුඩා තටාකයකින් සමන්විත බැවින් ආරක්ෂිතව දියනෑමට සුදුසුය.

වැස්සත් සමඟම සිරියාවෙන් ඔප්නැංවෙන දුනුමාල ලලනාවිය නියං රකුසාටද බිලිවේ. ගල්තලාව පමණක් ඉතිරිවීමෙන් සිහිවන්නේ පැහැබර මනාලිය වැහැරී ගොස් සිටින අයුරුය. වර්ෂා සමයට ඇගේ සුව විඳීමට පැමිණෙන සංචාරකයන්ගෙන් පිරී ඉතිරී යන භූමියෙහි තැනින් තැන පොලිතින්, හිස් ටින් සහ බෝතල් ආදී අපද්‍රව්‍යවලින් පිරී පවතී. දුනුමාල ඇල්ල නැරඹීමට පැමිණෙන ඔබේ වගකීම වන්නේ ඇගේ සිරි විඳින අතරම ඈව නිරුපද්‍රිතව අනාගතයට භාරකිරීමයි.

] ගයාන් තුදුස්ක [



ඒ පාරත් මේ පාරට...

# මිනිසුන්ව කියුණු කළ සමාජවාදයේ අසිපත - සෝවියට් සාහිත්‍යය



මේ තියෙන්නෙ 1962දී ඩේවිඩ් ෂොලොමොවිච් විසින් ගත් ලෙනින් රාජ්‍ය පුස්තකාලයේ කියවීමේ ශාලාවේ ඡායාරූපයක්. සමාජ ප්‍රගමනයෙහිලා බර අවි අතට දෙනු වෙනුවට, සමාජවාදය බල කළේ කියැවීමටය.. දැනුම හඹා යාමටය.. උසස් පරිකල්පනයක් සහිත මිනිසුන් බිහිකිරීමටය...

මේ සමාජවාදී රුසියාවේ සාහිත්‍යය පිළිබඳව ප්‍රවීණ සාහිත්‍යවේදී ඩබ්ලිව්. ඒ. අබේසිංහ මහතා විසින් සෝවියට් දේශය සඟරාවට 1981දී තැබූ සටහනකි.

"සමාජවාදී විප්ලවයෙන් බිහිව අවුරුදු හැට දෙකක් තුළ අතු ඉති ලා වැඩුණු සෝවියට් සාහිත්‍යයේ විස්තර කියන්නට තබා හඳුන්වන්නටවත් මෙවැනි කෙටි නිබන්ධනයකින් බැරිය. එබැවින් මෙහිලා සෝවියට් සාහිත්‍යය ගැන කළ හැකි වන්නේ ඉතා සිහින් දළ සටහනක් ඉදිරිපත් කිරීම පමණි.

අද වනාහි සෝවියට් දේශයෙහි වෙසෙන ලේඛකයෝ අට දහස ඉක්මවති. මේ සියළු දෙනා වෘත්තියෙන්ම ලේඛකයෝය. සෝවියට් ලේඛක සංගමයට අයිති නැති පිරිස මෙයට අමතරවය. හැම අවුරුද්දකම පොත් 80,000කට වඩා සෝවියට් දේශයෙහි ලියැවෙයි. ඒවා පිටපත් කෝටි හැත්තෑවකින් පමණ නිකුත් වෙයි. එක් දිනකට මුද්‍රණ මන්දිර වලින් නිකුත් වන පොත් සංඛ්‍යාව පනස් ලක්ෂය ඉක්මවයි.

60 වන සෝවියට් සංවත්සරය වන විට සෝවියට් දේශයෙහි ලියවී තිබූ පොත් හා පත්‍රිකා ප්‍රමාණය ලක්ෂ තිහකට වැඩි ය. මේ පොත්පත් සියල්ල ඉකුත් එම 60 අවුරුද්ද තුළදී පිටපත් කෝටි 4700 කින් මුද්‍රණ දොරින් ප්‍රකාශයට පත්විය. මුළු පෘථිවිය මත ජීවත් වන සෑම කෙනෙකුටම මේ පොත් සමසේ බෙදා දුනහොත් එක් අයකුට පොත් දහයක්වත් ලැබෙනු ඇත.

සෝවියට් දේශයේ දී නිකුත් වන පොත්පත් ප්‍රමාණයෙන් තුනෙන් එක් කොටසක් සාහිත්‍ය පොත්ය. ඒ කියන්නේ හැම පොත් තුනකින්ම එකක් එක්කෝ ප්‍රබන්ධ කෘතියකි; නැත්නම් කාව්‍යයකි.

විප්ලවයේ 60 වන සංවත්සරය දක්වා කාලය තුළ සෝවියට් දේශයේ නිකුත් කළ සාහිත්‍ය පොත්වල ඒ කියන්නේ ප්‍රබන්ධ කතා හා කාව්‍යවල පිටපත් ප්‍රමාණය කෝටි 1000 ඉක්මවා සිටියි.

සෝවියට් දේශයෙහි වන ප්‍රකාශන මන්දිර විසින් රුසියානු ඇතුළු සියලුම ජනරජ භාෂාවලින්ද තවත් යුරෝපීය, ආසියාතික හා අප්‍රිකානු භාෂා 62 කින් ද සාහිත්‍ය කෘති ප්‍රකාශ කෙරෙති. සෝවියට් දේශයෙහි තරම් සාහිත්‍යය පොතපත පළ කරන පරිවර්තනය වන අන් කිසිදු රටක් අද ලොවේ නැත. අවුරුද්දකට සෝවියට් දේශයේ පලකෙරෙන විදේශ සාහිත්‍ය කෘතීන් ගණන 8000 ඉක්මවයි. ඒවායේ පිටපත් සංඛ්‍යාව කෝටි 25 ක් ඉක්මවා සිටියි.

මෙතරම් සංඛ්‍යාවක් සාහිත්‍ය කෘතීන් පළ වීමෙන් පෙනී යනුයේ සෝවියට් ජනතාව එපමණටම කියැවීමට පුරුදු වී සිටින බවය. සෝවියට් ජනතාවගෙන් සියයට හැත්තෑ දෙනෙක් තමන්ගේ විවේක කාලය වඩාත්ම යොදවනුයේ පොතපත කියැවීමට බැව් සෝවියට් සමාජ විද්‍යාඥයෝ හෙළි කරති. ඇමරිකානු ජනතාව කියැවීමට ගත කරන කාලය සාමාන්‍ය වශයෙන් දිනකට මිනිත්තු හයකි. සෝවියට් දේශයේ එම කාල ප්‍රමාණය එයට වඩා පස් ගුණයකින් වැඩිය. එනම් සෝවියට් දේශයේ කියවීමේ සාමාන්‍යය දිනකට මිනිත්තු 31 කි.

සෝවියට් ජනතාවගේ ප්‍රධානතම වින්දන මාර්ගය සාහිත්‍යය පොත පත කියවීම නම් ඔවුන් තමන්ගේ අධ්‍යාත්මික තෘප්තිය සොයන ප්‍රධාන කලා මාධ්‍යය සාහිත්‍යය පොත පත බව පෙනී යයි. ඉන් හැඟෙන්නේ කිමෙක්ද? අනෙකක් නොව සෝවියට් සාහිත්‍ය කෘතීන් ඒ තරමටම ජනතාව අතර ජනප්‍රිය බවය. ඒ පමණට ජනප්‍රිය වීමට තරම් සෝවියට් සාහිත්‍ය පොතපත අර්ථවත් බවය: ප්‍රසාද වන බවය; සුන්දර බවය.

සැබැවින්ම ජීවිතයේ සෞන්දර්යය මේ යැයි කියන, අධ්‍යාත්මික තෘප්තිය ලබා දෙන, ජීවිතය හා ජීවත් වීමේ අරමුණ අර්ථවත් කරන, ජීවිතයේ පරමාර්ථයන් උසස් තැනට ගෙන යන, ජීවත්වීම පූර්ණත්වයට පත් කෙරෙන අර්ථවත් වූ ද අතිශයින් සුන්දර වූද සාහිත්‍යයක් ඉකුත් හැට දෙවසර තුළ දී සෝවියට් ලේඛකයින් විසින් බිහිකර ඇත්තේය. "

බොරැල්ල, සරණපාල හිමි මාවත, 45/95 බී, ස්ථානයේ පදිංචි බී. පුෂ්ප කුමාර වන මා විසින් අංක 43/20, නුගගහ පෙදෙස, පිළියන්දල පාර, මහරගම පිහිටි නියමුවා ප්‍රකාශන ආයතනයේ මුද්‍රණය කරවා ප්‍රසිද්ධ කරන ලදී.